කෙසෙල් වගාව සඳහා ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සංග්‍රහය

SLGAP

DEPARTMENT OF AGRICULTURE - SRI LANKA

සෞඛ්‍යාරක්ෂිත ආහාර
නිරෝගිමත් දිවියක්
Safe Food Good Health

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

2025

කෙසෙල් වගාව සඳහා ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සංග්‍රහය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2025

ප්‍රකාශක කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පළමු මුද්‍රණය 2016

පළමු සංස්කරණය හා දෙවන මුද්‍රණය 2023

දෙවන සංස්කරණය හා තෙවන මුද්‍රණය 2025

කෙසෙල් වගාව සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සංග්‍රහය

තෙවන මුද්‍රණය (2025)

තාක්ෂණික දායකත්වය

ආචාර්ය ඒ.ජේ. වරුසවිතාන
ආචාර්ය කේ.එච්. සාරානන්ද
ආචාර්ය කේ.එම්.ඩී.ඩබ්.පී. නිශාන්ත
ආචාර්ය එච්.ආර්.යූ.ටී. එරබදුපිටිය
ආචාර්ය පී.එච්. රණවීර
එම්.එස්.ඩබ්. ප්‍රනාන්දු
යූ.ජේ. ගුණවර්ධන
එල්.කේ. විජේසේකර
යූ.එල්.ආර්.එස්. පෙරේරා

සංස්කරණය

ආචාර්ය එච්.ආර්.යූ.ටී. එරබදුපිටිය
ඊ.එම්.ආර්.ඩී. එදිරිසිංහ
ඩබ්.ඒ.වයි.පී. අබේරත්න

ප්‍රකාශන කළමනාකරණය

ඩබ්.එල්. හිරාන් පීරිස්
ආර්.ජී.ඒ. ගුණසේකර

සහය ප්‍රකාශන කළමනාකරණය

එල්.ඩබ්.එල්.බී. නාරංගම්මන
එච්.එම්.යූ. හේරත්

පරිගණක පිටු සැකසීම හා නිර්මාණය

එල්.ජී. කුමුදු සෙනවිරත්න

පිටකවරය නිර්මාණය

ආර්.එල්. සේනාරත්න

කෙසෙල් වගාව සඳහා යහපත් කෘෂි පිළිවෙත්

පළමු මුද්‍රණය (2016)

තාක්ෂණික දායකත්වය

ආර්.එස්. විජේසේකර
ආචාර්ය සුජාතා වීරසිංහ
එස්. එන්. ලසන්ත රත්නවීර
එච්.ආර්.යූ.ටී. එරබදුපිටිය
ඒ.එස්.එම්. රොෂාන්
එස්.ටී.එස්. බණ්ඩාර

දෙවන මුද්‍රණය (2023)

ආචාර්ය ශිරෝමනී එදිරිමාන්න
ඩබ්.ජී.පී.ජී. වීරරත්න
එස්.එස්. වැලිගමගේ
සී. කේ. ඩී වෙල්ලාල
එච්.ඒ.ආර්.පී. විලාසිනී

සංස්කරණය
ඩී.එස්. රත්නසිංහ
එල්.ඒ.පී. පෙරේරා
චාමරී නිලුෂි ද සිල්වා
එම්.එස්.අමලියා කුමාරගේ
ජේ.එල්. ශශිකලා ජීවනී

පටුන

පිටු අංකය

1.0 ශ්‍රී ලංකා යහපත් කෘෂි පිළිවෙත් (SL- GAP) සහතිකකරණය......................... 01 - 02

1.1 අරමුණු 01

1.2 අර්ථ දැක්වීම්.. 01-02

2.0 හැඳින්වීම .... 03 - 04

3.0 ශ්‍රී ලංකා යහපත් කෘෂි පිළිවෙත් (SL- GAP) අනුව කෙසෙල් වගාව සිදු කිරීම සඳහා වූ ප්‍රමිතීන්.. 05 - 39

3.1 වගාව සඳහා ඉඩමක් තෝරා ගැනීම හා ඉඩම කළමනාකරණය 05-06

3.2 ගොවිපල ව්‍යුහ කළමනාකරණය.. 07-08

3.3 රෝපණ ද්‍රව්‍ය තෝරා ගැනීම හා වගා නඩත්තුව.................................. 08-15

3.4 පොහොර යෙදීම 15-18

3.5 ජල සම්පාදනය හා ජල කළමනාකරණය.. 18-19

3.6 පළිබෝධ පාලනය 19-30

3.7 අස්වනු නෙළීම හා පශ්චාත් අස්වනු හැසිරවීම...................................... 30-34

3.8 සේවක සෞඛ්‍ය, ආරක්ෂාව හා සුභසාධනය.. 34-35

3.9 ලේඛන හා වාර්තා තබා ගැනීම.. 35-39

4.0 SL-GAP සහතිකකරණ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු පියවර 40-41

ඇමුණුම්

ඇමුණුම් 01 - ගොවිපල වාර්තා නඩත්තුව සඳහා ආදර්ශ ආකෘතිය............... 42-53

ඇමුණුම් 02 - කෙසෙල් වගාවේදී **SL-GAP** සහතිකකරණය ලබාගැනීම සඳහා ස්වයං ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර ගැනීමට අදාල පිරික්සුම් ලැයිස්තුව........ 54-57

පරිශීලන ග්‍රන්ථ 58

1. ශ්‍රී ලංකා යහපත් කෘෂි පිළිවෙත් (SL- GAP) සහතිකකරණය

1.1. අරමුණු (Objectives)

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වලට අනුකූල වන පරිදි කෙසෙල් නිෂ්පාදනය කිරීමේ දී සහ පසු අස්වනු හැසිරවීමේදී අනුගමනය කිරීම සඳහා අදාල ප්‍රමිතීන් සරලව හඳුන්වාදීම මෙහි එක් අරමුණකි.

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යටතේ පරිසර හිතකාමී ලෙස සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක නිෂ්පාදන සකස් කිරීමේදී නිෂ්පාදකයන්ට, නිෂ්පාදන හසුරුවන්නන්ට, පුහුණුකරුවන්ට සහ මෙම වගා ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන්නන්හට එම ප්‍රමිතීන්වල වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා දී ඒ සඳහා ඔවුන් පෙළඹවීම මෙහි තවත් අරමුණකි.

1.2. අර්ථ දැක්වීම් (Definitions)

යහපත් කෘෂිකාර්මික පිළිවෙත්
Good Agricultural Practices

නිෂ්පාදනවල සෞඛ්‍යාරක්ෂිත බව හෝ ගුණාත්මක බව කෙරෙහි ඇතිවන අන්තරායකාරී බලපෑම අවම කරමින් තිරසාර පාරිසරික පැවැත්ම හා ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂණය හා සුබසාධනය තහවුරු වන පරිදි යම් බෝගයක් නිෂ්පාදනය කිරීමේදී ගොවිපල තුළදී සිදු කරනු ලබන ඊට අදාල වන සියළුම ක්‍රියාකාරකම් ''යහපත් කෘෂිකාර්මික පිළිවෙත්'' ලෙස හඳුන්වයි.

රසායනික ද්‍රව්‍ය (Chemical substances)

පොහොර, පළිබෝධනාශක, හෝමෝන සහ වෙනත් පාංශු ආකලන ආදී ඒකාකාරී රසායනික සංයුතියක් සහිත ද්‍රව්‍ය මෙලෙස හඳුන්වයි.

පළිබෝධනාශක (Pesticides)

පළිබෝධකයින්ගේ ගහණය පාලනය කිරීම සඳහා භාවිතා කරනු ලබන රසායනිකයන් හෝ ජෛවීය සංයෝග පළිබෝධනාශක වේ.

පළිබෝධකයින් (Pests)

සලකනු ලබන බෝගයක, එහි අස්වැන්නට හෝ බෝගයට ආර්ථික හානි සිදු කරන කෘමීන්, පෘෂ්ඨ වංශීන් සහ වෙනත් සතුන්, වල් පැලෑටි, දිලීර, බැක්ටීරියා, වෛරස් හා පරපෝෂිතයින් ඇතුළු සියළුම රෝග කාරකයින් පළිබෝධකයින් ලෙස හඳුන්වයි.

ආහාර උපද්‍රව (Food Hazards)

පාරිභෝගිකයා වෙත අහිතකර ප්‍රතිඵල ඇති කරවන ආහාර තුළ පවතින භෞතික, රසායනික හෝ ජෛව කාරක, ආහාර උපද්‍රව ලෙස හඳුන්වයි.

අන්තරායකාරී ද්‍රව්‍ය
(Hazardous substances)

මිනිසාට, ගොවිපල සතුන්ට, බෝගවලට හෝ පරිසරයට හානි කරන භෞතික,

ජෛවීය රසායනික ද්‍රව්‍ය හෝ සංයෝග, අහිතකර ක්‍ෂුද්‍ර ජීවීන්, අන්තරායකාරී ද්‍රව්‍ය ලෙස හඳුන්වයි.

අනුරේඛනය (Traceability)

ගොවිපල නිෂ්පාදනයක නිෂ්පාදන ක්‍රියාවලියේ ආසන්න ඉතිහාසය, එනම් ගොවිපල පිහිටීම, නිෂ්පාදන සකස් කිරීම, වෙළඳපොලට ඉදිරිපත් කිරීම දක්වා වූ සියළුම ක්‍රියාවලීන් පසු විපරම් කිරීමට ඇති හැකියාව අනුරේඛනයයි. මෙය ක්ෂණික ප්‍රතිචාර කේතයකින් (QR- Quick Response Code) ඉදිරිපත් කෙරේ.

භෞතික හා රසායනික දූෂණය
(Physical & Chemical Contamination)

අහිතකර ද්‍රව්‍ය හෝ සංයෝග මඟින් හෝ වෙනත් ආගන්තුක ද්‍රව්‍ය හේතුවෙන් බෝගයට, එහි නිෂ්පාදන වලට හෝ ඒ අවට පරිසරයට කරනු ලබන බලපෑමෙන් නිෂ්පාදනයේ සෞඛ්‍යාරක්ෂිත බවට හෝ ගුණාත්මයට ඇතිවන අහිතකර බලපෑම දූෂණය වීම ලෙස හඳුන්වයි.

2. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වගා කරන පලතුරු වර්ග අතරින් කෙසෙල් වලට ප්‍රධාන ස්ථානයක් හිමිවේ. ඉහළ සංස්කෘතික වටිනාකමක් ද ඖෂධීය වටිනාකමක් හා ඉහළ කාර්මික විභවයක් ද ඇති මෙම බෝගය ප්‍රධාන වශයෙන් පලතුරක් ලෙස ද එළවළුවක් ලෙස ද ලාංකීය ජනතාව අතර ප්‍රචලිතව ඇත. ගෙවතු වගාවක් මෙන්ම වාණිජ වගාවක් ලෙස ද එකසේ ජනප්‍රිය මෙම බෝගයේ දේශීය පරිභෝජනය ද ඉහළ යමින් පවතින අතරම අපනයන විභවය ද සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී.

කෙසෙල් බෝගය *(Musa* spp*)*

කෙසෙල් බෝගය මියුසාසියේ (Musaceae) කුලයට අයත් වේ. ඉන්දියාව සහ මලයාසියාව කේන්ද්‍රකොට ගත් ගිණිකොනදිග කලාපයේ සම්භවය වී ඇත. ශ්‍රී ලංකාවේ පලතුරු වගා වපසරියෙන්, කෙසෙල් වගා කළ භූමි ප්‍රමාණය 54% පමණ වේ. මුහුදු මට්ටමේ සිට මීටර් 1500 දක්වා වූ මිලිමීටර 1250 - 1900 දක්වා පැතිරුණු වර්ෂාපතනයක් සහිත ප්‍රදේශ කෙසෙල් වගාවට යෝග්‍ය වේ. ප්‍රශස්ත උෂ්ණත්ව පරාසය 18°C - 35°C පමණ වේ. මනා ජලවහනයකින් යුත් පුළුල් පාංශු පරාසයක් තුළ වගා කළ හැකි අතර ප්‍රශස්ත pH පරාසය 5.5 - 6.5 වේ.

ශ්‍රී ලංකාව තුළ සුපිරි වෙළෙඳසැල් ජාලයේ සීඝ්‍ර ව්‍යාප්ත වීමත්, සංචාරක ව්‍යාපාරයේ සීඝ්‍ර දියුණුවත්, ශ්‍රී ලාංකීය ජනතාවගේ ඒක පුද්ගල ආදායම වැඩි වීමත්, ආනයනික පලතුරු පිළිබඳ ජනතාව තුළ ඇති විශ්වාසය පළුදු වීමත් සමඟ කෙසෙල් ඇතුළු අනෙකුත් දේශීය පලතුරු සඳහා ඇති ඉල්ලුම දිනෙන් දිනම ඉහළ යමින් පවතී. ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන එළවළු හා පලතුරු වලට ඉල්ලුමක් පැවතියත් අපනයන තත්ත්වයන් සපුරාලන සුදුසු ගුණාත්මක නිෂ්පාදනයන් ප්‍රමාණවත් පරිදි නොමැති වීම එළවළු, පලතුරු අපනයනකරුවන් මුහුණ පා ඇති ප්‍රධානතම ගැටළුව වී ඇත.

එළවළු හා පලතුරු වගාව සඳහා ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රමිතීන් අනුව සකස් කළ කෙසෙල් බෝගය සඳහා වූ යහපත් කෘෂි පිළිවෙත් සංග්‍රහය නව සංස්කරණයක් ලෙස මෙසේ ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත. පාරිභෝගිකයාට උසස් ගුණාත්මයෙන් යුත් නැවුම්, සෞඛ්‍ය ආරක්ෂිත එළවළු හා පලතුරු නිෂ්පාදනයක් ලබා දීමත් තිරසාර වගාවක් පවත්වා ගනිමින් පරිසරය හා වගාකරුවන් ආරක්ෂා කිරීමත් මෙම යහපත් කෘෂි පිළිවෙත් සංග්‍රහය සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වේ.

මෙහිදී ප්‍රධාන වශයෙන් නිෂ්පාදිතයේ සෞඛ්‍ය ආරක්ෂිත බව සඳහා වැදගත්වන පළිබෝධනාශක හා බැරලෝහ අවශේෂ මෙන්ම හානිකර ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සිදුවිය හැකි හානි වළක්වා ගැනීමත් ගොවිපල ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා සුබසාධනය සැලසීමත්, පරිසරයේ තිරසාර බව ආරක්ෂා කිරීමත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් අත්කර ගත හැක.

පරිසරයට සිදු වන හානිය අවම කරමින්, සමාජමය වටිනාකම් ආරක්ෂා කර ගනිමින් ආර්ථික ලාභයක් ද සහිතව ඉහළ ගුණාත්මයෙන් යුත් කෙසෙල් නිෂ්පාදනය කිරීමේ දී හා පශ්චාත් අස්වනු හැසිරවීමේ කටයුතු වලදී අනුගමනය කළ යුතු පිළිවෙත් පිළිබඳ විග්‍රහයක් මෙහිදී ඉදිරිපත් කරනු ලබයි.

රූපය 01 : ප්‍රමිතීන් අනුව සකස් කළ කෙසෙල් වගාවක්

3. ශ්‍රී ලංකා යහපත් කෘෂි පිළිවෙත් (SL- GAP) අනුව කෙසෙල් වගාව සිදු කිරීම සඳහා වූ ප්‍රමිතීන්

3.1. වගාව සඳහා ඉඩමක් තෝරා ගැනීම හා ඉඩම කළමනාකරණය

ජෛවීයව සහ රසායනිකව කෙසෙල් වගාව හා එහි නිෂ්පාදන දූෂණය වීමට ඇති ඉඩකඩ පිළිබඳව සොයා බැලීමට වගාව සඳහා තෝරාගත් ඉඩම, පෙර භාවිතා කර ඇත්තේ කුමන කටයුතු සඳහා ද යන්න විමසා බැලීමත්. එසේම අදාළ ඉඩම අවට ඇති අනෙක් ඉඩම් වල සිදුකරන කටයුතු පිළිබඳව පරීක්ෂා කිරීමත් අවශ්‍ය වේ. මෙලෙස දූෂණයවීමේ අවදානමක් හඳුනා ගතහොත් ඒ පිළිබඳව අදාල වාර්තාව තබා ගැනීම වැදගත්.

ජෛවීය හෝ රසායනික දූෂ්‍ය වීමක් පිළිබඳ සැලකිය යුතු අවදානමක් හඳුනාගතහොත් වගාවට පෙර ඒ සඳහා ප්‍රතිකර්ම යෙදිය යුතු අතර එම සිදුකළ ප්‍රතිකර්ම පිළිබඳව සටහන් තබා ගැනීම වැදගත්.

> සංවර්ධන කටයුතු සඳහා පුරවන ලද ඉඩම් මෙන්ම විෂ අපද්‍රව්‍ය, කැනීම් කටයුතුවලදී ඉවත් කළ අපද්‍රව්‍ය, ඛණිජ අපද්‍රව්‍ය, ආරෝග්‍යශාලා අපද්‍රව්‍ය, පිළිස්සූ ද්‍රව්‍ය සහ කාර්මික අපද්‍රව්‍ය බැහැර කළ ඉඩම් ආහාර බෝග වගාව සඳහා සුදුසු නොවේ.

වගා කටයුතු සඳහා යොදා ගැනීමට යෝජිත භූමිය අවට ඇති ඉඩම්, සත්ත්ව පාලනයට, කසළ බැහැර කිරීමට, පොහොර හා රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම ආදී දේ සඳහා භාවිතා කරන්නේ නම් හෝ අවට ඉඩම් වලින් ගලා එන ජලය නිසා නිෂ්පාදන භූමිය දූෂණය වන්නේ නම්, එවැනි භූමි වල වගා කරන බෝග ආහාරයට ගැනීමෙන් මිනිසාගේ සෞඛ්‍යයට අවදානමක් ඇතිවීමේ හැකියාවක් පවතී. එබැවින් සුදුසු පරිදි එම තත්ත්ව කළමනා කිරීමෙන් පසු පමණක් එම ඉඩම් භාවිතා කළ හැකිය.

වගාවට යෝජිත නව ඉඩම්වල සිදුවිය හැකි පරිසර හා අනෙකුත් භෞතික හානි පිළිබඳව ඇගයීමක් කර ඒ පිළිබඳව වාර්තා තබා ගැනීම වැදගත්වේ.

යම් ඉඩමක සැලකිය යුතු පාරිසරික හා භෞතික හානි පිළිබඳ අවදානමක් නිරීක්ෂණය කළහොත් එම ඉඩම වගා කිරීම සඳහා භාවිතයට නොගන්න. එසේ නොමැති නම්, විය හැකි හානි වැළැක්වීමට හෝ අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන තිබිය යුතුය.

වාණිජ මට්ටමේ වගා සඳහා මහා පරිමාණ කෙසෙල් වගාවට ඉතාමත්ම සුදුසු ඉඩම් කොටස හඳුනා ගැනීමට ගොවිපලේ ඉඩම් වල යෝග්‍යතාවය තක්සේරු කිරීමකර සුදුසු ඉඩම් කොටස කෙසෙල් වගා කිරීම සඳහා වෙන් කර තැබිය හැකි අතර, ගොවිපලේ අනෙකුත් ඉඩම් කොටස් ගොඩනැඟිලි, ගබඩා, වැඩපොලවල්, කොම්පෝස්ට් සකස් කරන ස්ථාන ආදිය පිහිටුවීමට භාවිතා කළ හැකිය.

කෙසෙල් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඉඩම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාංශු සංරක්ෂණ නිර්දේශ වලට අනුකූල වන ලෙස පිහිටි ඉඩම් විය යුතුය. මුහුදු මට්ටමේ සිට මීටර් 1500 දක්වා ප්‍රදේශවල වඩාත් සාර්ථකව කෙසෙල් වගා කළ හැක. කෙසෙල් වගා කිරීම සඳහා 60% ට වඩා වැඩි ඉතා අධික බෑවුම් සහිත ඉඩම් භාවිතා නොකළ යුතුය. සුළු බෑවුම් සහිත ඉඩම් භාවිතයේ දී පාංශු සංරක්‍ෂණ ක්‍රම අනුගමනය කිරීම අනිවාර්ය වේ.

ඉතා නිසරු ඉඩම් කොටස් ගොවිපලේ පවතී නම්, ඒවා තවදුරටත් පරිහානිය කරා යාම වලක්වා ගැනීම හෝ අඩු කිරීම සඳහා ක්‍රියා කිරීම වැදගත් වේ.

කෙසෙල් නිෂ්පාදනය සඳහා සුදුසු ප්‍රදේශ පෙන්වා දීම සඳහා මහා පරිමාණ ඉඩමක නම් භූ විෂමතා සිතියමක් පිළියෙල කළ හැකිය.

වගා භූමිය සඳහා සිතියමක් සකස් කිරීම

වගා භූමියේ ප්‍රධාන කොටස් පෙන්වීම සඳහා පිහිටීමේ දළ සිතියමක් පිළියෙල කිරීම වැදගත් වේ. බෝග නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඉඩම් කොටස්/ක්ෂේත්‍ර (අංක හා වපසරිය සමඟ), පොහොර/ රසායන ද්‍රව්‍ය, ගබඩා පිහිටි ස්ථාන, ජල ප්‍රභවය වෙනත් ගොඩනැඟිලි පාරවල් ආදී ප්‍රධාන අංග එහි ලකුණුකර දැක්වීම වැදගත් වේ.



රූපය 02 : වගා භූමියේ ප්‍රධාන කොටස් පෙන්වීම සඳහා සකස් කළ සිතියම

කෙසෙල් සඳහා පසේ හොඳ ජලවහනයක් සහිත මීටර් 1 ½ ක් පමණ ගැඹුරු සැහැල්ලු පසක් හා කාබනික ද්‍රව්‍ය බහුල ලෝම පසක් වඩා සුදුසු වේ. එහෙත් බොහෝ ප්‍රදේශවලට අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේද යොදා ගනිමින් කෙසෙල් වගාව සිදු කළ හැක. තද මැටි සහිත ඉඩම් හා ජලවහනය දුර්වල ඉඩම් නුසුදුසු වේ.

කෙසෙල් වගාව සඳහා යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේදී භූමියේ ඇති පස හා ජල ප්‍රභවයන්, පළිබෝධනාශක අවශේෂ, බැර ලෝහ හා හානිකර ක්ෂුද්‍ර ජීවීන් සඳහා පරීක්ෂා කළ යුතුය. ඒ පිළිබඳව වාර්තා තබා ගැනීම අවශ්‍ය වේ. වගාවට පෙර එක් වතාවක් ලෙස හා අවදානම අනුව වසරකට වරක් ලෙස කළ හැකිය.

පසේ pH අගය 5.5 - 6.5 අතර පැවතීම සුදුසුය.

3.2. ගොවිපල ව්‍යුහ කළමනාකරණය (Farm structures)

මායිම් වැට

ගොවිපල/වගා භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකරන්න. එය ජීව හෝ අජීවී වැටක් විය හැක. එහි ඇතුල්වන හා පිටවන ස්ථාන සුදුසු ලෙස සකස් කිරීමට සැළකිලිමත් විය යුතුය.

වාණිජ මට්ටමේ කෙසෙල් වගාවක් පිහිටුවීමේ දී සුළං බාධක ලෙස ගොවිපලේ මායිම දිගේ ග්ලිරිසීඩියා හෝ සුදුසු වෙනත් ශාක වගා කළ හැකිය. සුළං අධික ප්‍රදේශවල වගා ස්ථාපනයට පෙර සුළං බාධක සකස් කිරීම හෝ ගස් සිටුවීම ඉතා වැදගත් වේ.

සේවක පහසුකම්

ගොවිපලේ වැඩ කරන සේවකයින් සඳහා ආහාර ගැනීම, ඇඳුම් මාරු කිරීම, අත් සේදීම සහ වැසිකිළි පහසුකම් ආදි අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සුදුසු ස්ථාන ආසන්නයේ තිබීම වැදගත් වේ.

අවශ්‍ය ප්‍රථමාධාර

හදිසි අවස්ථාවක දී භාවිතා කිරීම සඳහා අවශ්‍යවන ද්‍රව්‍ය සහිතව ප්‍රථමාධාර පෙට්ටියක් පහසුවෙන් ලඟාවිය හැකි ස්ථිර ස්ථානයක තබා ගන්න.

තාවකාලික ගබඩා ස්ථාන

කෙසෙල් අස්වැන්න ඇසිරීම සිදු කරන හා තාවකාලිකව ගබඩාකර තබන ස්ථාන ඉතා පිරිසිදුව පිළිවෙලකට තබන්න.

- බෝග අපද්‍රව්‍ය හා සුන්බුන්, බෝග නිෂ්පාදන ප්‍රදේශ වලින් ඉවත්කර පිරිසිදුව තබා ගැනීම වැදගත්.
- සේවකයින්ට සිදු විය හැකි අනතුරු අවම වන පරිදි නිරන්තරයෙන් ගොවිපල වාහන, යන්ත්‍රෝපකරණ, ආයුධ ආදිය ආරක්ෂා සහිතව ගබඩා කිරීම සිදු කරන්න.

ජල සම්පාදන පද්ධති

පිරිසිදු ජලය කාර්යක්ෂමව බෙදා හැරීම සඳහා ජලසම්පාදන පද්ධති ඉතා පිරිසිදුව පවත්වා ගනිමින් හොඳින් නඩත්තු කරන්න. නිසි පරිදි ජලවහන කාණු පද්ධතිය නඩත්තු කිරීම මඟින් වැඩිපුර ඇති අමතර ජලය කෙෂ්ත්‍රයෙන් ඉවත් කළ හැක.

කසළ බඳුන්

ස්වාභාවිකව දිරා යන හා එසේ දිරා නොයන අපද්‍රව්‍ය ලෙස වෙන වෙනම වෙන් කර අවශ්‍ය කළමනාකරණ කටයුතු සිදුකරන තෙක් කසළ නියමිත පරිදි අසුරා තබන්න.

කෙසෙල් නිෂ්පාදනය කරන ප්‍රදේශ, අස්වනු තේරීම හා ඇසිරීම කරන ස්ථාන වලට ගෘහාශ්‍රිත සතුන් හා ගොවිපල සතුන් ඇතුල්වීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු සිදුකරන්න.

වගා ආරක්ෂණ දැල්, විදුලි වැටවල් හෝ අධි ධ්වනි ක්‍රම ඇතුළුව ඇම, උගුල් වැනි පළිබෝධ පාලන උපක්‍රම යොදා ඇති විට ඒවා නිසි පරිදි නඩත්තු කිරීම වැදගත් වේ.

ගොවිපල උපකරණ සහ වෙනත් ව්‍යුහ කළමනාකරණය

අස්වනු සමඟ කෙලින්ම ගැටෙන උපකරණ, බඳුන් හා ඇසුරුම් ද්‍රව්‍ය එම නිෂ්පාදන දූෂණය නොකෙරෙන ද්‍රව්‍යවලින් සාදා තිබෙන ඒවා විය යුතුය.

විවිධ අපද්‍රව්‍ය, රසායනික වර්ග හා වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය ගබඩා කිරීමට භාවිතා කරන බඳුන් පැහැදිලිව හඳුනා ගත යුතු අතර ඒවා නිෂ්පාදන ඇසිරීමට හෝ රැගෙන යාමට භාවිත නොකරන්න.

බෝග නිෂ්පාදන දූෂණයවීම අවම කිරීම සඳහා උපකරණ හා ඇසිරීමේ බඳුන් නිරන්තරයෙන් පිරිසිදු කරන්න.

නිෂ්පාදන ඇසිරීමේ බඳුන්, කෘෂි රසායනික හා පොහොර ඇති ස්ථානවලින් වෙන්ව ගබඩා කිරීමට කටයුතු කරන්න.

උපකරණ, බඳුන් හා ඇසිරීමේ ද්‍රව්‍යවල භාවිතයට සුදුසු නුසුදුසු බව ගැන නිතර පරීක්ෂා කර බලමින්, නුසුදුසු ඒවා ඉවත් කිරීමට පියවර ගන්න.

ගොවිපල වෙනත් ව්‍යුහ

අස්වනු තේරීම, ඇසිරීම, හැසිරවීම හා ගබඩා කර තබන ගොඩනැඟිලි හා වෙනත් ව්‍යුහ එම බෝග නිෂ්පාදන දූෂණය වීම අවම කෙරෙන පරිදි ඉදිකිරීම හා නඩත්තු කිරීම කළ යුතු වේ.

බෝග නිෂ්පාදන දූෂණයවීම වැළැක්වීම සඳහා ලිහිසි තෙල්, ඉන්ධන හා ගොවිපල යන්ත්‍ර සූත්‍ර තිබෙන තැන් හා බෝග හැසිරවීම තේරීම, ඇසිරීම හා ගබඩා කර තබන ප්‍රදේශ එකිනෙකින් වෙන් කර තබන්න.

බෝග නිෂ්පාදන ක්ෂේත්‍ර හා ජල මූලාශ්‍රයන් දූෂණයවීම අවම වන පරිදි මළ, මූත්‍රා හා වෙනත් අපද්‍රව්‍ය බැහැර කිරීම හා ජලාපවහන පද්ධති ඉදි කිරීම හා නඩත්තු කිරීම සිදු කරන්න.

පිරිසිදු කිරීම සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී නිර්දේශිත රසායනික ද්‍රව්‍ය තෝරා ගැනීම හා නියමිත පරිදි ගබඩා කර තැබීම සිදු කරන්න.

3.3. රෝපණ ද්‍රව්‍ය තෝරා ගැනීම හා වගා නඩත්තුව

උසස් ගුණාත්මයෙන් යුත් රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීම

කෙසෙල් වගාවක් ස්ථාපිත කිරීම සඳහා අස්වැන්නේ ගුණාත්මය, වෙළඳපොල ඉල්ලුම, රෝග හා පළිබෝධයන් මෙන්ම අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව, දේශගුණික අනුවර්තනයවීම් ආදී කරුණු ගැන සලකා, ගුණාත්මයෙන් යුත් රෝපණ ද්‍රව්‍ය හා සුදුසු ප්‍රභේද තෝරා ගැනීම කළ යුතු වේ.

වෙළඳපොල අවශ්‍යතාවයන් සපුරාලිය හැකි පරිදි කෙසෙල් ප්‍රභේද තෝරා ගැනීම කළ හැකිය.

රෝපණ ද්‍රව්‍ය ලබා ගත් ස්ථානය, දිනය හා ප්‍රමාණය ගැන වාර්තා තබා ගැනීම වැදගත් වේ.

එක් එක් කෘෂි දේශගුණික කලාපයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර ඇති කෙසෙල් වර්ග.

	පලතුරක් ලෙස	ව්‍යංජනයක් ලෙස
වියළි කලාපය	කෝලිකුට්ටු, ඇඹුල්, සීනි කෙසෙල්, කණ්ඩුල	අළු කෙසෙල්, මොන්දන් වර්ග, ඇටමුරු වර්ග, පුලතිසි, කණ්ඩුල
අතරමැදි කලාපය	කෝලිකුට්ටු, ඇඹුල්, සීනි කෙසෙල්, ආනමාළු, ඇම්බන්, කණ්ඩුල	අළු කෙසෙල්, මොන්දන් වර්ග ඇටමුරු, කිතල, පුලතිසි, කණ්ඩුල
තෙත් කලාපය	ඇඹුල්, සීනි කෙසෙල්, පුවාලු, ආනමාළු, ඇම්බන්, බිම් කෙසෙල්, සුවඳැල්, නේත්‍රාම්පලං, රත් කෙසෙල්, කණ්ඩුල	මොන්දන් වර්ග, ඇටමුරු, කිතල, පුලතිසි, කණ්ඩුල

නිර්දේශිත ප්‍රභේද

රූපය 03. කණ්ඩුල
(ද්වීකාර්ය ප්‍රභේදයකි)

රූපය 04. පුලතිසි
(පිසීමට සුදුසු ප්‍රභේදයකි)

රූපය 05. ප්‍රසාද්
(අළු කෙසෙල් වර්ණයකි)

රූපය 06. නදී
(ඇඹුල් කෙසෙල් වර්ණයකි)

රූපය 07. මිල්ලෑව සුවඳැල්
(සුවඳැල් වර්ණයකි)

රූපය 08. ගන්නෝරුව රත් කෙසෙල්

* ද්වීකාර්ය - පලතුරක් ලෙස මෙන්ම එළවළුවක් ලෙස ද යොදා ගැනීමට හැකි බැවින්

රූපය 09. ගන්නෝරුව සීනි කෙසෙල්

රූපය 10 පැරකුම් (සීනි කෙසෙල් වර්ණයකි)

රූපය 11. අග්‍රා (කෝලිකුට්ටු වර්ණයකි)

කෂේත්‍රයේ සිටුවීම සඳහා සුදුසු රෝපණ ද්‍රව්‍ය

කෙසෙල් වගාවක් පිහිටුවන විට වඩාත්ම සුදුසු වන්නේ ශක්තිමත්, නිරෝගී, අළුතින්ම ගලවා ගත් මොරෙයියන් භාවිතා කිරීමයි.

කෙසෙල් වගාවක දී භාවිතා කළ හැකි පැළ ප්‍රධාන වශයෙන් ආකාර 03 කි.

01. කඩුපත් මොරෙයියන්
02. කන්‍යා මොරෙයියන්
03. පටක රෝපිත පැළ

01. කඩුපත් මොරෙයියන්

කෙසෙල් වගාවක් අළුතින්ම පිහිටවූ විට මුල් අවධිවලදී මතු වන ශක්තිමත් මොරෙයියන්ය. මේවායේ කෝමය (අලය) කොටස (රෙසෝමය) ප්‍රමාණයෙන් විශාල බැවින් මොරෙයියාගේ වර්ධන දිරිය වැඩිය. කඳ කේතු ආකාරයක් ගනී. පත්‍ර පටු, දිගටි කඩුවක හැඩයක් ගන්නා බැවින් ''කඩුපත් මොරෙයියන්'' වශයෙන් හැඳින්වේ. ඇතැම් ප්‍රභේදවල හට ගන්නා මොරෙයියන් වැඩි කොටසක් කඩුපත් මොරෙයියන් වේ. මෙම පැළ සිටුවීම සඳහා යෝග්‍ය වේ.

රූපය 12. කඩුපත් මොරෙයියන්

02. කන්‍යා මොරෙයියන්

මෙම මොරෙයියන්ගේ පත්‍ර පළලය. කඳෙහි හැඩය මද වශයෙන් කේතු ආකාරයි. කෙසෙල් අලය මධ්‍යම ප්‍රමාණයේ විශාලත්වයක් සහිතය. මෙම පැළවල වර්ධනය වේගවත් අතර විශාල කැන් හටගනී. මේ නිසා මෙවැනි පැළ ද සිටුවීම සඳහා සුදුසුය.

රූපය 13. කන්‍යා මොරෙයියන්

පළල් පත්‍ර මොරෙයියන් (දියපත් මොරෙයියන්) සිටුවීම සඳහා සුදුසු නොවේ.

03. පටක රෝපිත පැළ

ස්වාභාවිකව මතුවන මොරෙයියන් මෙන් නොව රසායනාගාරයක් තුළ විශේෂ අවධානයක් යටතේ පටකයක් රෝපණය කිරීම මඟින් පටක රෝපිත පැළ නිපදවේ. මෙම පැළ සිටුවීමට යොදා ගන්නා අවස්ථාව වන විට සාමාන්‍යයෙන් මාස 12-15 පමණ රසායනාගාරයක් තුළ හා දැඩි කිරීමේ ඒකකයක් තුළ වර්ධනය වී කායික වශයෙන් පරිණත වූ පැළයකි. ඒවා මනාව වැඩුනු මූල පද්ධතියක් හා පළල් පත්‍ර ඇති බාහිර රෝගකාරක වලට නිරාවරණය නොවූ පැළ වේ. විශාල පරිමාණයෙන් නිපදවෙන පටක රෝපිත පැළ ඒකාකාරී බැවින් වගාවක් ආරම්භ කළ විට ඒකාකාරී වගාවක් හා හොඳ අස්වැන්නක් ලබා ගත හැකිවේ.

රූපය 14. පටක රෝපිත පැළ

සිටුවීමට සුදුසු පටක රෝපිත පැළයක ලක්ෂණ

- වෛරස්වලින් තොරවීම. (ප්‍රධානවම කෙසෙල් වඳ පීදීමේ රෝගය)
- පැළයෙහි උස 25 cm ක් 30 cm ක් වීම.
- නිරෝගී කෙසෙල් පත්‍ර 4 ක් හෝ 5 ක් තිබීම.
- හොඳින් වර්ධනය වූ මූල පද්ධතිය.
- පළිබෝධකයින්ගෙන් හා රෝග වාහකයින්ගෙන් තොරවීම.

පැළ සිටුවීමට සූදානම් කිරීම

මව් ශාකයෙන් ලබා ගන්නා පැළ උදුරා ගත් වහාම එනම් හැකි පමණ ඉක්මනින් සිටුවීම ඉතා සුදුසුය. එවිට සාර්ථකත්වය වැඩිය.

මව් ශාකයෙන් ගලවාගත් පැළ ප්‍රතිකාරකර සිටුවීම තුළින් යම් කෘමි හානි වළක්වා ගත හැකිය. ඒ සඳහා, පැළ වල මුල් සහ පත්‍ර කපා ඉවත් නොකර, එම පැළ වල ඉතා දික් වූ මුල් ඇත්නම් ඒවා කෙටි කර කපා, පැළයේ අලය ඇති කොටස පමණක් නටන උණු ජලයෙහි තත්පර 30 (විනාඩි ½) ගිල්වා ඉවතට ගෙන සිටුවීම වැදගත්ය. මෙහිදී විශාල බැරලයකට හෝ සාස්පානකට ජලය දමා නටවා ඒ තුළ පැළ ගිල්වා ගත යුතුයි. මෙහිදී, කෙසෙල් ගුල්ලාගේ ජීවන චක්‍රයේ සියළුම අවස්ථාවන් ද, වටපණුවන් සිටී නම් එම වටපණුවන් ද විනාශ වේ.

බිම් පිළියෙල කිරීම

බිම තෝරා ගැනීමේදී මීට පෙර කෙසෙල් වගාව සිදු කර රෝග හා පළිබෝධ හානි වලට පාත්‍ර වී ඇත්නම් ඒ සඳහා සැලකිලිමත්ව සහ හැකි සෑම අවස්ථාවකම බෝග මාරුව සිදු කරන්න. මහා පරිමාණ කෙසෙල් වගාවන් පිහිටුවීමට පෙර භූමියේ ඇති ඉලුක්, ඇටෝර වැනි බහු වාර්ෂික තෘණ වර්ග ඉවත් කර ගැනීමත් ඉඩම මද බෑවුම් සහිත නම් පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීමත් සිදු කරන්න. ඉන් පසු ඉඩමේ පස ගැඹුරට සීසෑම සිදුකොට කැට පොඩි කර ගැනීම සුදුසුයි.

පසේ ජලවහනය දුර්වල නම් කෙසෙල් පැළ සිටුවීමට පෙර ජලවහනය වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු වේ.

පැළ අතර පරතරය හා ක්ෂේත්‍රයේ පිහිටුවීම

වගා කිරීමේ පරතරය

වගා කරනු ලබන කෙසෙල් ප්‍රභේදය, පසේ සාරවත්භාවය සහ වගාව පවත්වා ගැනීමට බලාපොරොත්තු වන කාල සීමාව අනුව වගා කරන පරතරය වෙනස් වේ. වගාව පවත්වා ගන්නා කාල සීමාව අනුව ප්‍රධාන ක්‍රම 02 කි.

01. බහු වාර්ෂික ක්‍රමයට වගා කිරීම

02. වාර්ෂික ක්‍රමයට වගා කිරීම

01. බහු වාර්ෂික ක්‍රමයට වගා කිරීම

මෙහිදී සාම්ප්‍රදායික ක්‍රමයට පැළ සිටුවා පඳුරක් ආකාරයට නඩත්තු කර වසර 5 ක් හෝ ඊට වැඩි කාලයක් පවත්වා ගනී.

වගුව 03 : බහු වාර්ෂික වගාවක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පරතර

ප්‍රභේදය	පරතරය		අක්කරයට අවශ්‍ය පැළ ගණන
	මීටර්	අඩි	
කෝලිකුට්ටු, බිම් කෙසෙල්	2.4 × 2.4	8 × 8	703
ආනමාළු, ඇඹුන්	3.6 × 3.6	12 × 12	312
ඇඹුල් සහ අනෙකුත් වර්ග	3 × 3	10 × 10	450

ඉහත පරතරයට වලවල් ලකුණු කිරීමෙන් අනතුරුව සෙ.මී. 60 × 60 × 60 ප්‍රමාණයේ වලවල් කැපීම කළ යුතුය.

02. වාර්ෂික ක්‍රමයට වගා කිරීම

මෙම වගා ක්‍රමය යටතේ කෙසෙල් වගා කළවිට බහුවාර්ෂික ක්‍රමයට වඩා තුන් ගුණයකින් පමණ අස්වැන්න හා ආදායම වැඩිකර ගත හැක. එය මෙම ක්‍රමයේ ඇති විශේෂත්වයයි. මෙයට අමතරව වගාවට සපයන ජලය ද වඩා කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීමට ද කෙසෙල් වගාවේ ගැටලුවක්ව පවතින පැනමා වැනි දරුණු දිලීර රෝග ව්‍යාප්ත කිරීම අඩු කර ගැනීමට ද මෙම ක්‍රමයෙන් හැකි වේ.

වගුව 04: වාර්ෂික වගාවක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පරතර

ප්‍රභේදය	පරතරය		අක්කරයට අවශ්‍ය පැළ ගණන
	මීටර්	අඩි	
ආනමාළු, ඇම්බන්	3 × 1.5	10 × 5	899
ඇඹුල්	3 × 1	10 × 3	1349
කෝලිකුට්ටු, අළු කෙසෙල්	2.5 × 1	8 × 3	1618

වැඩි ඝනත්වයක් යටතේ වාර්ෂික වගාවක් ලෙස නඩත්තු කරන්නේ නම් උදලු තල 1 ½ ක් (සෙ.මී. 45-50 ක්) පමණ ගැඹුරකට වලවල් කැපීම ප්‍රමාණවත් වේ.

වාර්ෂික වගාවක මූලධර්මය වනුයේ ඒකක ක්ෂේත්‍රයක වැඩි ගස් සංඛ්‍යාවක් සිටුවා මව් ගස් වලින් පමණක් එක් වරක් අස්වැන්නක් ලබා ගන්නා වාර්ෂික වගා චක්‍රයක් පවත්වා ගැනීමයි.

පැළ සිටුවීම

පැළ සිටුවීමට සති දෙකකට පමණ පෙර හොඳින් දිරාපත්වූ කාබනික පොහොර මතුපිට පස් සමඟ හොඳින් මිශ්‍ර කර එයින් වල පුරවන්න. තවද තෙත් කලාපයේදී වලකට ඩොලමයිට් ග්‍රෑම් 500 ක් බැගින් යොදන්න. පැළ සිටුවීමට දින දෙකකට පෙර නිර්දේශිත මූලික රසායනික පොහොර මිශ්‍රණය නිර්දේශිත ප්‍රමාණයෙන් වලේ පස් වලට මිශ්‍ර කරන්න. මොරෙයියාගේ අලය කොටස පමණක් පසට යට වනසේ වලවල්වල මැදින් සිටුවන්න.

තද වැසි සහිත කාලය මගහැර පැළ සිටුවීම කළ යුතුයි. පහතරට තෙත් හා අතරමැදි කලාප වල මැයි, ජූනි මාස වලදී ද, වියළි කලාපයේ ඔක්තෝබර් මාසයේදී ද, පැළ සිටුවීම කළ හැකිය. තවද ජලසම්පාදන පහසුකම් තිබේ නම් වසරේ ඕනෑම කාලයක වගා කළ හැක.

කෙසෙල් වගාව නඩත්තු කිරීම

උසස් ගුණාත්මයෙන් යුත් වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා කෙසෙල් වගාවක් හොඳින් නඩත්තු කිරීම ඉතා වැදගත් වේ. පඳුරු පාලනය කිරීම, පොහොර යෙදීම, වල් පාලනය, වෙනත් ක්ෂේත්‍ර කටයුතු, රෝග හා පළිබෝධ පාලනය හා අවශ්‍ය විට ජල සම්පාදනය කිරීම යන කටයුතු කෙසෙල් වගාවක් හොඳින් නඩත්තු කිරීමේදී ඉතා වැදගත් වෙයි.

කෙසෙල් පඳුරු පාලනය

පඳුරු පාලනය මඟින් කැන්වල විශාලත්වය වැඩිවීම, ගෙඩිවල බර වැඩිවීම, රෝග, පළිබෝධ පාලනය වීම සිදුවේ. යාබද පඳුරු අතර පරතරය පාලනය කරමින් වගාව දිගුකාලයක් පවත්වා ගත හැකිවේ.

මෙහිදී කෙසෙල් පැළයක් සිටුවා මාස හතරක් පමණ ගතවන අවස්ථාව දක්වා ඇතිවන සියළුම මොරෙයියන් ඉවත් කිරීම.

මාස හතරකට පසුව හොඳින් වර්ධනය වන එක් කඩුපත් මොරෙයියෙකු හට වැඩීමට ඉඩ හැරීම.

ඉන් පසුව මව් පැළය පීදීම වනවිට තව එක් මොරෙයියෙකුට වැඩීමට ඉඩ හැරීම. මව් ගසේ අස්වැන්න නෙළන විට තව මොරෙයියකුට වැඩීමට ඉඩ සැලැස්වීම සිදුකළ හැකිය.

වැඩි ඝනත්වයක් යටතේ වාර්ෂික ක්‍රමයට පැළ සිටුවා ඇති වගාවන්හි මව් ශාකයේ මොරෙයියන් ඇති වීමට ඉඩ දෙනු නොලැබේ. එහි තනි ගසක් වශයෙන් මව් ගස පමණක් නඩත්තු කෙරේ.

වල් පැලෑටි පාලනය (රසායනික නොවන)

වගාව පිහිටුවා වසරක් පමණ ගතවන තෙක් වල් පැලෑටි පාලනය කිරීම ඉතා වැදගත් වේ. නමුත් වගාව තහවුරු වූ පසු ආලෝකය අඩු නිසා වල් පැලෑටි පාලනය වීමක් සිදුවේ.

ශාකයේ/ පඳුරේ පාදයේ සිට මීටරයක් පමණ අරයක ඇති ප්‍රදේශය වල් පැලෑටි වලින් තොරව තබා ගත යුතුයි. මෙම ප්‍රදේශය වසුනකින් ආවරණය කර තැබීම කරනු ලැබේ. කිසිදු අවස්ථාවක වගාව තුළ සම්පූර්ණයෙන්ම උදලු ගා පස නිරාවරණය කළ යුතු නොවේ.

වෙනත් ක්ෂේත්‍ර කටයුතු

කැන් ආවරණය කිරීම

කැන් ආවරණය කිරීම තුළින් උසස් ප්‍රමිතියෙන් යුත් ගෙඩි ලබා ගත හැක. එමඟින් ගෙඩිවල විශාලත්වය වැඩිවීම, ප්‍රසන්න පෙනුමක් ලැබීම, ගෙඩි දුර්වර්ණවීම වැළැක්වීම සිදුවේ. අපනයනය පිණිස වගා කරන විට මෙය අනිවාර්යයෙන් කළ යුතු ක්‍රියාවකි.

සවිවර වූ බෑගයකින් කෙසෙල් කැන් ආවරණය කිරීම වඩාත් සුදුසුය. එම ආවරණය සඳහා වර්ණයේ බලපෑමක් ඇති නොවන අතර සවිවර වූ හා මනා වාතාශ්‍රයක් ලැබෙන කැන් ආවරණයක් වීම වැදගත් වේ. (පොලිතීන් ආවරණවල සිදුරු කපා වාතාශ්‍රය වැඩිකළ හැක) පීදී සති 2-4 කදී කැන් ආවරණය කිරීම කළ යුතුය.

රූපය 15. කෙසෙල් කැන් ආවරණය කිරීම

මෙම ආවරණ යෙදීමේදී කැන ආවරණය වන සේ ඉහළින් ගැට ගසා, පහළ කෙළවර විවෘතව තබන්න. කැනෙහි අවසන් ඇවරිය ඇතිවිය හැකි මට්ටමේ සිට සෙ.මී. 30 ක් පහළින් පහළ කෙළවර තිබිය යුතුය.

මෙලෙස ආවරණය කළ කෙසෙල් කැන් නිසි අවස්ථාවේදී නෙලා ගැනීම පහසුවීම සඳහා කැන හටගත් දිනය ආවරණයේ සළකුණු කරන්න.

ආධාරක සැපයීම

කෙසෙල් කැන් මේරීමට පෙර කෙසෙල් ගස් කඩා වැටීම වැළැක්වීම සඳහා ශක්තිමත් ලී දඬු හෝ උණ බම්බු උපයෝගී කරගෙන ආධාරක සැපයීම සිදු කළ යුතු වේ. කෙසෙල් කැනෙහි වහල්ල කඳට සවිවන ස්ථානයට මෙම ආධාරකය සැපයිය යුතුය.

කෙසෙල් මුහය ඉවත් කිරීම

කෙසෙල් ගස පීදී, කැනෙහි ඇවරි සියල්ල ඇති වූ පසු මුහය ඉවත් කරන්න. කෙසෙල් කැනෙහි අවසාන ඇවරියේ සිට සෙ.මී. 7.5 - 10 (අඟල් 3/4 ක්) පමණ පහතින් නටුව ඉතිරි වන සේ මුහය ඉවත් කිරීම වඩා සුදුසුය.

අවසාන ඇවරි ඉවත් කිරීම

බොහෝවිට කෙසෙල් කැනෙහි අවසාන ඇවරි කිහිපය හොඳින් වර්ධනය නොවේ. මෙවන් ඇවරිවල හට ගන්නා ගෙඩි ද ඉතා කුඩාය. වෙළඳපොළ අගය ද අඩුය. කෙසෙල් මුව ඉවත්කරන අවස්ථාවේදීම මෙවැනි ඇවරි ද ඉවත් කරන්න. එවිට සෙසු ඇවරිවල හට ගන්නා ගෙඩි වඩාත් පෘෂ්ඨිමත්ව වැඩේ.

රූපය 16. කෙසෙල් මුහය ඉවත් කිරීම

3.4 පොහොර යෙදීම

පොහොර හෝ පසට එකතු කරන වෙනත් ද්‍රව්‍ය නිසා කෙසෙල් අස්වනු රසායනිකව හෝ ජීව විද්‍යාත්මකව දූෂණය වීමට ඇති ඉඩකඩ ගැන පරීක්ෂා කර බැලිය යුතු අතර, සැලකිය යුතු අනතුරක් හඳුනා ගතහොත් ඒ සම්බන්ධයෙන් සටහනක් තබා ගැනීම කළ යුතුයි.

පොහොර හෝ පසට එකතු කරන වෙනත් ද්‍රව්‍ය නිසා නිෂ්පාදන දූෂණය විය හැකි බවට හඳුනා ගතහොත් එම අවදානම අවම කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.

බැර ලෝහ මඟින් නිෂ්පාදන දූෂණය වීමේ අවදානම අවම වන පරිදි පොහොර හා පසට එකතු කරන වෙනත් ද්‍රව්‍ය තෝරා ගැනීමට කටයුතු කරන්න. විශේෂයෙන් ඒ සඳහා පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ රසායන පොහොර භාවිතා කිරීම වැදගත්.

කෙසෙල් නිෂ්පාදනය කිරීමේදී යොදා ගන්නා පොහොර සඳහා මිනිස් මළ ද්‍රව්‍ය මිශ්‍ර නොවිය යුතුය.

කෙසෙල් නිෂ්පාදනය කරන ප්‍රදේශ හා ජල ප්‍රභව දූෂණය වීමට ඇති ඉඩකඩ අවම කිරීම සඳහා කාබනික පොහොර ගබඩා කිරීම, මිශ්‍ර කිරීම හා පැටවීම සඳහා භාවිතා කරන ස්ථාන නිෂ්පාදන භූමියෙන් වෙන්ව පිහිටුවා ගන්න.

පොහොර හා පසට එකතු කරන වෙනත් ද්‍රව්‍ය ලබාගත් ස්ථානය, වර්ගය, ප්‍රමාණය හා දිනය ආදී ඒවා සපයා ගැනීමට අදාල තොරතුරු වාර්තා කර තබා ගන්න.

භාවිතා කළ වර්ගය, දිනය, යෙදූ ප්‍රදේශය, ප්‍රමාණය, ක්‍රමය, යෙදූ පුද්ගලයා ආදී පොහොර යෙදීමට අදාල තොරතුරු ද වාර්තා කර තබා ගන්න.

කාබනික පොහොර යෙදීමේ දී, හොඳින් දිරූ කාබනික පොහොර කි.ග්‍රෑම් 10ක් එක් වලකට මිශ්‍ර කිරීම වැදගත් වේ.

පොහොර කාන්දු වීමෙන් හා සෝදායාම මඟින් අපතේ යාම අවම කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයට අනුකූලව හෝ පස් හා පත්‍ර පරීක්ෂා කර තීරණය කළ ආකාරයකට හෝ පාංශු පෝෂක යෙදීම සිදු කරන්න.

වාණිජ කෙසෙල් වගාවන් සඳහා කාබනික පොහොර සමඟ රසායනික පොහොර යෙදීම යෝග්‍ය වේ.

වියළි, අතරමැදි හා තෙත් කලාපයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත පොහොර මිශ්‍රණයන් පහත දැක්වේ.

රසායනික පොහොර යෙදීම

රසායනික පොහොර යෙදීම කලාපය, ජල සම්පාදන ක්‍රමය හා වගා ක්‍රමය අනුව වෙනස් වේ.

වගුව 05. තෙත් කලාපය සඳහා බහු වාර්ෂික ක්‍රමයට කෙසෙල් වගා කිරීමේදී යෙදිය යුතු පොහොර නිර්දේශය

යොදන අවස්ථාව	පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්)			
	යූරියා	ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP)	මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP)	කීසරයිට්
මූලික පොහොර (සිටුවීමට දින 1-2කට පෙර)	55	50	95	-
සිටුවා මාස 02කට පසු	110	100	190	100
සෑම මාස 4කට වරක්	110	100	190	100

වගුව 06. තෙත් කලාපය සඳහා වාර්ෂික ක්‍රමයට කෙසෙල් වගා කිරීමේදී යෙදිය යුතු පොහොර නිර්දේශය

යොදන අවස්ථාව	පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්)			
	යූරියා	ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP)	මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP)	කීසරයිට්
මූලික පොහොර (සිටුවීමට දින 1-2කට පෙර)	30	80	150	-
සිටුවා මාස 02කට පසු	60	40	250	100
සිටුවා මාස 04කට පසු	150	-	250	100
සිටුවා මාස 8-9කට පසු හෝ කැන මතු වන විට	150	-	250	100

වගුව 07. වියළි හා අතරමැදි කලාප සඳහා ජල සම්පාදන තත්ත්ව යටතේ බහුවාර්ෂික වගාවක් ලෙස යෙදිය යුතු පොහොර නිර්දේශය

යොදන අවස්ථාව	පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්)		
	යූරියා	ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP)	මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP)
මූලික පොහොර (සිටුවීමට දින 1-2කට පෙර)	60	40	125
සිටුවා මාස 02කට පසු	120	80	250
සෑම මාස 04කට වරක්	120	80	250

වගුව 08. වියළි හා අතරමැදි කලාපය සඳහා වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ බහු වාර්ෂික වගාවක් ලෙස යෙදිය යුතු පොහොර නිර්දේශය

යොදන අවස්ථාව	පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්)		
	යූරියා	ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP)	මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP)
මූලික පොහොර (සිටුවීමට දින 1-2කට පෙර)	60	40	125
සිටුවා මාස 02කට පසු	120	80	250
සෑම මාස 06කට වරක්	180	120	375

වගුව 09. වියළි කලාපය හා අතරමැදි කලාපය සඳහා වාර්ෂික වගාවක් ලෙස ජල සම්පාදන තත්ත්ව යටතේ යෙදිය යුතු පොහොර නිර්දේශය

යොදන අවස්ථාව	පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්)		
	යූරියා	ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP)	මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP)
මූලික පොහොර (සිටුවීමට දින 1-2කට පෙර)	30	80	150
සිටුවා මාස 02කට පසු	60	40	250
සිටුවා මාස 04කට පසු	150	-	250
සිටුවා මාස 8-9 පසු හෝ කැන මතු වන විට	150	-	250

රසායනික පොහොර, කාබනික පොහොරත් (වලකට කි.ග්‍රෑම් 10 ක්) සමඟ එකට යෙදීම වඩාත් ඵලදායී වේ.

පසේ pH අගය 5.0 ට වඩා අඩු නම් තෙත් කලාපීය ප්‍රදේශවල පැළ සිටුවීමට සති දෙකකට පෙර වලක් සඳහා ඩොලමයිට් ග්‍රෑම් 500 ක් යෙදීම නිර්දේශ කරයි. ඩොලමයිට් රසායනික පොහොර සමඟ එකට යෙදීම නොකළ යුතුය. වියළි කලාපය සඳහා ඩොලමයිට් යෙදීම නිර්දේශ නොකරයි.

කෙසෙල් පඳුරේ සිට සෙ.මී. 30 ක් පමණ දුරින් පඳුර වටා නොගැඹුරු කාණුවක පොහොර විසුරුවා හැර වැළලීම කරයි. මුල් වලට සිදුවිය හැකි හානිය අවම වනසේ පසට පොහොර මිශ්‍ර කරන්න.

යොදන රසායනික, කාබනික හා වෙනත් ඕනෑම පොහොර වර්ගයක් පිළිබඳ විස්තර සටහන්කර තබා ගැනීම ඉතා වැදගත් වේ.

3.5 ජලසම්පාදනය හා ජල කළමනාකරණය

බෝග ජල අවශ්‍යතාවය, ජල සුලබතාවය හා පාංශු තෙතමන මට්ටම පදනම් කරගෙන ජල සම්පාදනය කරන්න.

වියළි කාල වලදී ජලසම්පාදනය කළ හැකිනම් කැන් වල විශාලත්වය හා ගෙඩි වල ප්‍රමාණය වැඩි කර ගත හැකිය. ජල සම්පාදන කාලාන්තරය පසේ ස්වභාවය මත හා වාර්ෂික වර්ෂාපතනය මත රඳා පවතී.

ජල සම්පාදනය සඳහා යොදාගන්නා ජලය වගාවට සුදුසු තත්ත්වයේ තිබිය යුතුය. ජල ප්‍රභවයට දූෂක එකතු නොවන සේ සකසා භාවිතා කිරීම වැදගත් වේ.

කෙසෙල් වගාවන් සඳහා ජලසම්පාදනය කිරීමට භාවිතා කරන ජලයේ ගුණාත්මය, බැර ලෝහ හා පළිබෝධනාශක අවශේෂ සඳහා පරීක්ෂාකර බැලීමෙන් වගාව දූෂණයවේ දැයි බලාගත හැකිය.

කෙසෙල් සඳහා මතුපිට ජලසම්පාදන ක්‍රමයක් ලෙස බේසම් ජල සම්පාදනය භාවිතා කළ හැකිය. හැකි හා උචිත අවස්ථා වලදී වැසි ජලය රැස් කිරීමේ ක්‍රම හා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම (විසුරුම් හා බිංදු ජල සම්පාදන ක්‍රම) යොදා ගැනීමට හැකිය.

රටේ නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලව ජලය එකතු කිරීම, ගබඩා කිරීම හා භාවිතය කළ යුතු වේ.

ඉඩමට, පසට හා අවට පරිසරයට හානියක් නොවන ජල ප්‍රභවයකින් ජලසම්පාදනය සිදු කරන්න.

ගොවිපල භූමිය තුළ හා ඉන් පිටතදී පරිසර හානි සිදුවීමට ඇති ඉඩකඩ අවම වන ආකාරයට වැසිකිළි හා ජලාපවහන පද්ධති වල ජලය බැහැර කිරීම කළ යුතුය.

භූමියෙන් පිටතට යන ජලය පරිසර හානි අවම වන ආකාරයට කළමනාකරණය කිරීම හෝ ප්‍රතිකාර කර බැහැර කිරීම කළ යුතු වේ.

3.6 පළිබෝධ පාලනය

3.6.1 කෙසෙල් වගාවේ ප්‍රධාන කෘමි පාලනය

සාර්ථක කෙසෙල් වගාවක් පවත්වා ගනිමින්, උසස් ගුණාත්මයෙන් යුතුව වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා බෝගයේ පළිබෝධ කළමනාකරණය කිරීම ඉතා වැදගත්ය. කෙසේ වෙතත් ආර්ථික වශයෙන් වැදගත් පළිබෝධකයින් පාලනය කිරීම සඳහා අනිසි ලෙස රසායනික ද්‍රව්‍ය යෙදීම හේතු කොට ගෙන කෙසෙල් බෝගය මත යැපෙන කෘමීන්ගේ ස්වභාවික සතුරන් විනාශ වෙයි. මෙම තත්ත්වය මෙම බෝග යට හානි කරන අළුත් පළිබෝධකයින් බිහි වීමට හේතු වෙයි. මෙයට අමතරව පළිබෝධනාශක සඳහා ප්‍රතිරෝධී පළිබෝධ බිහිවීම, පරිසර දූෂණය, කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන වියදම ඉහළ යාම වැනි ජෛවීය, පාරිසරික, සමාජීය හා ආර්ථික බලපෑම් ද බොහෝය. මේ නිසා පළිබෝධ පාලනය සඳහා රසායනිකයන් භාවිතයේදී ඉතාමත් ප්‍රවේශම් විය යුතුව ඇත.

ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය

ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණයයේදී පහත සඳහන් පියවර අනුගමනය කළ හැක.

01. පරීක්ෂාකාරී වීම, හඳුනා ගැනීම හා ඉක්මනින් ක්‍රියා කිරීම

රෝග හා පළිබෝධ හඳුනා ගැනීම සඳහා ගොවිපල සේවකයන් පුහුණු කළ යුතුය. එවිට ඔවුන්ට නිතර නිතර වගාවන් පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මේ නිසා රෝගයක් හෝ පළිබෝධ හානියක් නිරීක්ෂණය කළ වහාම අවශ්‍ය ප්‍රතිකාර ආරම්භ කළ හැකිය.

02. පළිබෝධ වළක්වා ගැනීමේ ක්‍රියා මාර්ග යෙදීම

පළිබෝධ දුටු සැනින් එම පළිබෝධකයින් හා ඔවුන් හානි කළ ශාක කොටස් වහාම ක්ෂේත්‍රයෙන් ඉවත් කර විනාශ කරන්න. බෝග සනීපාරක්ෂාව කෙරෙහි විශේෂයෙන්

සැළකිලිමත් විය යුතු අතර හොඳ බෝග සනීපාරක්ෂාවක් පවත්වා ගෙන යාමට පියවර ගත යුතු වේ.

03. ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය

බෝග වගා කිරීමේදී රෝග හා පළිබෝධ වලට ඔරොත්තු දෙන ප්‍රභේද හා වගා කරන ප්‍රදේශයට උචිත ප්‍රභේද වගා කිරීම සඳහා තෝරා ගත යුතු වේ.

04. නිවැරදි රෝපණ ක්‍රියා භාවිතය

රෝග හා පළිබෝධ වලින් තොරව හොඳින් නඩත්තු කරන ලද වගාවකින් රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම ඉතා වැදගත් වේ. කෙසෙල් වගාව සඳහා සුදුසු ඉඩම් තෝරා ගැනීම, නිර්දේශිත ලෙස බිම් පිළියෙළ කිරීම හා බෝගය ස්ථාපිත කිරීම සිදු කළ යුතුයි. නිසි ලෙස කෙසෙල් පඳුරු නඩත්තු කිරීම, ක්‍රමවත් ලෙස ජල සම්පාදනය කිරීම, නිර්දේශිත ලෙස පොහොර භාවිතය, සාර්ථක ලෙස වල් මර්දනය කිරීම ආදිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අනුව ඉටු කළ යුතුය. එසේම නිර්දේශිත ආකාරයට අස්වනු නෙලීම හා පසු අස්වනු ක්‍රියා සිදු කිරීමද කළ යුතු වේ.

3.6.2. ප්‍රධාන කෘමි හානි සහ පාලන ක්‍රියා

කෙසෙල් ගුල්ලාගේ හානිය

කෙසෙල් වගාවට හානි කරන ප්‍රධාන පළිබෝධකයෙකු වේ. කෙසෙල් ගුල්ලා රෙරසෝමයට හානි කරන අල ගුල්ලා සහ කඳට හානි කරන කඳ ගුල්ලා ලෙසට ආකාර දෙකකි.

අල ගුල්ලා *(Cosmopolites sordidus)*

කෙසෙල් රෙරසෝමයේ හෝ කඳෙහි පස ආසන්නයේ වූ කඳෙහි තුවාල වූ ස්ථාන වල සහ සිදුරු තුළ බිත්තර දැමීම සිදු කරයි. පිටවන කීටයින් කඳ හෝ අලය තුළට ඇතුළු වී එහි කොටස් ආහාරයට ගනී. දරුණු ලෙස අල ගුල්ලාගේ හානියට ලක්වූ කෙසෙල් ගස්වල වර්ධනය බාලවේ. පත්‍ර කහ පැහැවී දුර්වල වැඩීමක් පෙන්වයි.

රූපය 17. සුහුඹුල් අල ගුල්ලා

රූපය 18. අල ගුල්ලාගේ හානිය

කඳ ගුල්ලා *(Odoiporus longicollis)*

කෙසෙල් කඳේ කැපුම් තුවාල හෝ සිදුරු තුළ බිත්තර දමයි. පිටවන කීටයෝ කඳ

තුළ පටක ආහාරයට ගනිමින් කුහර සාදති. හානිය දරුණු වූ විට, කඳ දුර්වලවීම නිසා මඳ සුළඟට පවා ගස කඩා වැටේ. ගස් කහ පැහැවී වර්ධනය බාලවේ. හට ගන්නා කෙසෙල් කැන් ප්‍රමාණයෙන් ඉතා කුඩා වේ. ගස්වල ගොබ කුණුවීම හා සිර වීම දක්නට ලැබේ.

රූපය 19. සුහුඹුල් කඳ ගුල්ලා

රූපය 20. කඳ ගුල්ලාගේ හානිය බාහිරින් හඳුනා ගැනීම

පාලන ක්‍රියා

නිරෝගී අල පමණක් සිටුවීම සඳහා භාවිතා කරන්න. පැළ ලබා ගන්නා වගාවේ මෙම හානිය නැති බව තහවුරු කරගත යුතුය.

පැළ සිටුවීමට පෙර නිර්දේශිත ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීම කළ හැක.

වගාව පිරිසිදුව පවත්වා ගැනීම සඳහා කෙසෙල් කැන කපාගත් පසුව ගසේ කඳ පස මට්ටමට මදක් පහළින් කපා ඉවත් කර, එම ස්ථානය පස් වලින් වසා දමන්න.

නිරෝගී කඳ කොටස් අඩි දෙකක් පමණ දිගට කපා, දෙකට පලා හෝ පෙති ලෙස කපා කැපුම් පෘෂ්ඨ පොළවෙහි ස්පර්ශ වනසේ වගාවේ තැන තැන තබා ඊට ආකර්ෂණය වන ගුල්ලන් ද සමඟ සතියකට හෝ දෙකකට වරක් බැගින් විනාශ කර දමන්න.

වගාවේ කෙසෙල් ගුල්ලාගේ හානිය සැලකිය යුතු පමණින් ඇති බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් රසායනික පාලන ක්‍රම අනුගමනය කරන්න.

වඩාත්ම වැදගත් වන්නේ ආරම්භයේ පටන්ම ක්ෂේත්‍ර පවිත්‍රතාවය තබා ගැනීමයි.

ඇම යෙදීම මගින් පාලනය සඳහා

කෙසෙල් කඳ පෙති වලට කපා පෙති 02 අතරට ෆිප්රොනිල් (Fipronil 3% GR හෝ තයෝසයික්ලෑම් හයිඩ්‍රජන් ඔක්සලේට් Thiocyclam (Hydrogen Oxalate) 4% GR උගුලකට 10 g ක් වනසේ යොදා ව්‍යාජ කඳෙන් උගුල් සකසා තබන්න. අක්කරයකට මෙවැනි ඇම 25-30 ක් පමණ වන සේ ක්ෂේත්‍රයේ තැනින් තැන තබන්න. (කෙසෙල් පෙති අතර කුඩා ගල් කැට කැබලි කිහිපයක් තබා සෙ.මී. ½ ක් පමණ අවකාශයක් තබන්න)

රූපය 21. කඳ කැබලි දෙකට පලා ක්ෂේත්‍රයේ තැබීම

කෙසෙල් පැළ මැක්කා

මෙම පළිබෝධකයා කෙසෙල් කැනට හානි කරනු ලබන අතර පැළ මැක්කන් විශේෂ දෙකක් අප රටේ හඳුනාගෙන ඇත. *Chaetanaphothrips signipennis* හා *Thrips hawaiiensis* එම විශේෂ දෙක වේ.

රූපය 22. විශාලනය කරන ලද සුහුඹුල් පැළ මැක්කා

(වැඩුණු පැළ මැක්කා සෙ.මී.1.5 ක් පමණ දිගුය. තද දුඹුරු පැහැතිය)

හානිය

ගෙඩි වල පොත්ත සූරා ආහාරයට ගැනීම නිසා මතුපිට දුඹුරු පැහැති ලප කැළැල් ඇතිවීම හෝ හානිය අධික විට ගෙඩි වල පොත්ත පිපිරී ද්විතියික ආසාදන ඇතිවීමෙන් අස්වැන්නේ ගුණාත්මය පිරිහී යයි. විශේෂයෙන් අපනයනය සඳහා කෙසෙල් නිෂ්පාදනය කිරීමේදී මෙම කෘමියා පාලනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

රූපය 23. පැළ මැක්කාගේ හානිය

පාලන ක්‍රියා

කෙසෙල් කැනෙහි ඇවරි බේරීම ආරම්භ වූ වහාම කැන් ආවරණය කිරීමෙන් මෙම කෘමි හානිය වළක්වා ගත හැකිය.

හානිය අධික නම් පමණක් කැන විවෘතවීම ආරම්භ වූ අවස්ථාවේදී හා කැනෙහි ඇවරි සියල්ල දිගහැරී අවසන් වූ පසු නිර්දේශිත ස්පර්ශක කෘමිනාශකයක් යොදන්න.

3.6.3. කෙසෙල් වගාවේ ප්‍රධාන රෝග පාලන ක්‍රියා

කෙසෙල් වගාවේ නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතය, සිටුවීමට පෙර මොරෙයියන්ට ප්‍රතිකාර කිරීම, නිවැරදි ජල සම්පාදන ක්‍රම භාවිතය, පඳුරු පාලනය කිරීම, වගා ක්ෂේත්‍රයේ පිරිසිදුබව පවත්වාගෙන යාම, (ඉදුණු සහ රෝගී පත්‍ර තියුණු පිහියක් ආධාරයෙන් ඉවත් කිරීම) කැන් කැපූ ගස්වල කඳන් ඉවත් කිරීම මඟින් කෙසෙල් වගාවන්ට ඇතිවන රෝග වළක්වා ගත හැකිය.

පැනමා රෝගය/ ෆියුසේරියම් මැලවීම
Fusarium oxysporum f.sp. cubense

බොහෝ කෙසෙල් ප්‍රභේදවලට ඇතිවිය හැකි දිලීර රෝගයකි. රෝග ලක්ෂණ බාහිරට දැකිය හැක්කේ පරිනත පඳුරුවලය. රෝග කාරක දිලීරයේ බලපෑම නිසා මුල්වල ඇති සනාල පටක අවහිර වීම නිසා එම පටක අවහිරවී, රතු දුඹුරු පැහැයට හැරේ. මෙය ක්‍රමයෙන් අලය හෙවත් රෛසෝමය දක්වාද පසුව කඳ දක්වාද පැතිරී යයි. පළමුව ගසේ පහළින් ඇති මේරූ පත්‍ර දීප්තිමත් කහ පැහැයකට හැරී නටුවෙන් කඩා වැටී, කඳ දිගේ එල්ලී පිහිටයි. මෙම තත්ත්වය ගසේ ඉහළ ප්‍රදේශය දක්වා ක්‍රමයෙන් පැතිරී යන අතර ජල හිඟ තත්ත්වයක දී මෙන් වියළී යයි. මෙසේ සිදුවන්නේ රෝග කාරක දිලීරය නිසා ගසේ ඉහළ කොටස වෙත ජලය හා පෝෂක ගමන් නොකිරීම හේතුවෙනි. මෙයට අමතරව ගසේ කඳ දික් අතට පුපුරා යාමක්ද සිදුවේ. මෙවැනි රෝග ලකෂණ පෙන්වන කඳක් හරස් අතට පලා බැලූ විට සනාල පටක පිහිටි ප්‍රදේශය දුඹුරු පැහැති වලයක් ආකාරයට දැකිය හැකිවේ.

රූපය 24. පැනමා රෝගය සහිත කඳේ හරස්කඩ දුඹුරු පැහැ ගැන්වී තිබීම

රූපය 25. පැනමා රෝගය සහිත පත්‍ර කහ පැහැවී කඩා වැටීම

පාලනය

- රෝගී වගාවකින් රෝපණ ද්‍රව්‍ය නොගැනීම.
- වගාවේ ජලවහනය දියුණු කිරීම.
- රෝගී පඳුරු හැකි ඉක්මනින් ගලවා පස් සමඟ ඉවත් කිරීම.
- රෝගයට ඔරොත්තු දෙන ප්‍රභේද වගා කිරීම (ඇඹුල් ප්‍රභේදය මෙම රෝගය සඳහා ඔරොත්තු දේ).
- රෝගී වගාවක සිට පිටතට එන විට හැකි සෑම අවස්ථාවකදීම දෙපා විෂබීජ නාශනය කර ගැනීම තුළින් දිලීර බීජාණු ව්‍යාප්තිය වැළැක්වීම.
- රෝගයට පාත්‍රවන ප්‍රභේද, තනි වගාවක් ලෙස නොව ඔරොත්තු දෙන ඇඹුල් ප්‍රභේදය සමඟ මිශ්‍රව වගා කිරීම.

ඇන්ත්‍රැක්නෝස් රෝගය
(Colletotrichum musae)

මෙම රෝගය දැකිය හැකි වන්නේ අස්වැන්න නෙලූ පසුව පසු අස්වනු රෝගයක් ලෙසය. නමුත්, අළු කෙසෙල් සහ සීනි කෙසෙල් වල ලපටි කැන් වල මෙම රෝග තත්ත්වය දැකිය හැකිය.

රෝග ලක්ෂණ

කුඩා ගෙඩිවල තැන්පත්වන දිලීර බීජාණු පොත්ත තුළින් ගෙඩියට ඇතුළු වේ. ලපටි කැන් වලට ආසාදනය වූ විට සම්පූර්ණයෙන්ම කළු පැහැවී වියළී යයි.

ගෙඩිවලින් මල් හැලී යාමටත් පෙර මෙම රෝග ලක්ෂණ දැකිය හැකිවේ.

රූපය 26. ඇන්ත්‍රැක්නෝස් රෝගයට පාත්‍ර වූ ලපටි කැන්වල රෝග ලක්ෂණ පෙන්වීම

දරුණු ලෙස හානිවූ විට ගෙඩි වියළී කළු පැහැවී ඒවා මතුපිට තැඹිලි පැහැයෙන් දිලීර බීජාණු ද දැකිය හැකිවේ. ක්‍රමයෙන් එම තත්ත්වය කැනේ මැද නාරටියට ද පැතිරීමෙන් කැනම ඇඹරී කළු වී යයි.

කෙසෙල් පත්‍ර හා කෙසෙල් මුහයද දිලීරයෙන් ආසාදනය විය හැක.

ඉදීම ආරම්භවීමත් සමඟ ගෙඩියේ පොත්ත මත තැන්පත්ව ඇති දිලීරයේ බීජාණු පහසුවෙන් ගෙඩිය තුළට ආසාදනය වේ. දුඹුරු පැහැති පැල්ලම් ලෙසින් මුලදී දැකිය හැකි වන අතර එම පැල්ලම් ක්‍රමයෙන් විශාල වී ගෙඩියේ අක්ෂයට සමාන්තරව කළු පැහැයෙන් යුතුව ගිලුණු ස්වභාවයකින් දිස්වේ. මෙම පැල්ලම් වලට යටින් ගෙඩියේ මදයෙහි තෙත් ස්වභාවයෙන් යුතු කුණුවීමක් ඇතිවිය හැකිය. ගෙඩිවල ආකර්ෂණීය පෙනුම නොමැති වීම නිසා වෙළඳපොල ඉල්ලුම අඩුවී යයි.

රූපය 27. ඇන්ත්‍රැක්නෝස් වැළඳුන ඉදුණු කෙසෙල් ගෙඩිමත රෝග ලක්ෂණ පෙන්වීම

පාලන ක්‍රියා

- වියළි පරඬැල් සහ දිරායන කඳන් ක්ෂේත්‍රයෙන් ඉවත් කර වගාව පිරිසිදුව තබා ගැනීම ඉතා වැදගත් වේ.

- රෝගී කොටස් ඉවත් කර පුළුස්සා විනාශ කරන්න.
- වගාවේ රෝගය බහුල නම් මුහයෙන් ඇවරි බේරීම ආරම්භවූ අවස්ථාවේ දී නිර්දේශිත දිලීර නාශකයක් නියමිත මාත්‍රාවෙන් යොදන්න.

දිලීර නාශකය	ජලය ලීටර් 10 ක මිශ්‍රකළ යුතු ප්‍රමාණය
ක්ලෝරොතැලොනිල් (Chlorothalonil 75% WP)	ග්‍රෑම් 20
ක්ලෝරොතැලොනිල් (Chlorothalonil 500g/l SC)	ග්‍රෑම් 30
මැන්කොසෙබ් (Mancozeb 80% WP)	ග්‍රෑම් 20
මැනෙබ් (Maneb) 80% WP)	ග්‍රෑම් 20
තයෝෆනේට් මීතයිල් (Thiophanate Methyl 70% WP)	ග්‍රෑම් 06
කාබෙන්ඩසීම් (Carbendazim 50% WP)	ග්‍රෑම් 07

- අස්වනු නෙළීමේදී කැන්වලට තුවාල සිදු නොවන පරිදි සිදු කරන්න.
- කැපූ කැන් වාතාශ්‍රය අඩු තෙතමනය වැඩි ස්ථාන වල ගබඩා කිරීමෙන් වළකින්න.

වදු පීදීම

වදු පීදීමේ වෛරසය නිසා මෙම රෝගය හට ගනී. ලංකාවේ කෙසෙල් වගාවේ දක්නට ලැබෙන ප්‍රධාන වෛරස් රෝගයකි. එමෙන්ම නිෂ්පාදනයට ඉතාම හානිදායී ලෙස බලපාන වෛරස් රෝගයකි. වගාවේ ඕනෑම වර්ධන අවධියකදී ආසාදනය විය හැකි මෙම රෝගය තෙත් කලාපයේ බහුලව දක්නට ලැබේ.

රෝග ලක්ෂණ

මෙම රෝගය ආසාදිත මව් ශාකයකින් මොරෙයියන්ට වැළඳීම ප්‍රාථමික ආසාදනය ලෙස හඳුන්වයි. මෙම ප්‍රාථමික ආසාදනයේදී ගසේ වර්ධනය බාලවීම හේතුවෙන් පත්‍ර කොපු දික් නොවී සෙව්වන්දියක් ආකාරයට පෙනේ. පත්‍ර කහවන් කොළ පැහැයට හැරේ. හරිතක්ෂය ඇතිවීම, පත්‍ර දාරයේ සිට ආරම්භ වී ක්‍රමයෙන් මැද නාරටිය දක්වා පැතිරේ. මෙසේ ප්‍රාථමික ආසාදනයට ලක්වූ ශාකයකින් කෙසෙල් කැනක් නිෂ්පාදනය නොවේ.

වැඩුණු ගස්වලට මෙම වෛරසය ආසාදනය වීම ද්විතීයික ආසාදනය ලෙස හඳුන්වයි. මෙහිදී අළුතින් ඇතිවන පත්‍ර කහ පැහැ වේ. මෙහිදී ප්ලෝයම පටකය ආසාදනය වීමෙන් අළුත් පත්‍රවල නටුවේ, මැද නාරටියේ සහ කුඩා නාරටි දිගේ තද කොළපාට ඉරි දැකිය හැකිවේ. පත්‍රවල දාර ඇතුලට හැකිලීම හා ගොබය සිරවීමක්ද සිදුවිය හැකිය. ශාකයේ ඉහළ කෙළවර පත්‍ර අතර දුර අඩුවීම නිසා පත්‍ර අවානක් ආකාරයට ඉහළට විහිදී පිහිටයි. වගාවේ අවසාන කාලයේදී ආසාදනය වුවහොත් දුර්වල කැන් ඇතිවිය හැකි අතර විකෘති ගෙඩි හටගනී.

පැතිරීම

ප්‍රධාන වශයෙන් රෝගය පැතිරෙන්නේ ආසාදිත රෝපණ ද්‍රව්‍ය මඟිනි. කෙසෙල් කුඩිත්තන් විසින් වෛරසය බෝ කිරීම නිසාද පැතිරීම සිදුවේ. තවද උපකරණ සහ වෙනත් යාන්ත්‍රික ක්‍රම මඟින්, යුෂ තැවරීම මඟින් රෝගය පැතිරීම සිදු වේ.

රූපය 28. වද පීදීමේ රෝග ලක්ෂණ කුඩා පැළවල පෙන්වීම

රෝග පාලනය

- රෝගී ශාක වලට නිර්දේශිත කෘමි නාශකයක් යෙදීමෙන් එහි සිටින කුඩිත්තන් විනාශ කරන්න. හැකි ඉක්මණින් රෝගී ගස් ඉවත් කර පුළුස්සා දැමීමට පියවර ගන්න.
- නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතා කරන්න.
- රෝගී පඳුරු වලින් සිටුවීම සඳහා පැළ ලබා නොගන්න.
- පටක රෝපණයෙන් පැළ ලබා ගන්නේ නම්, මව් ශාක වෛරස් හඳුනා ගැනීමේ පරීක්ෂණයකින් වෛරස් නොමැති බවට තහවුරු කරන්න.
- ආසාදිත ශාක මුල් අවධියේදීම නිවැරදිව හඳුනාගෙන වහාවෙන් ඉවත් කිරීමට පියවර ගන්න. නැවත වරක් නිරෝගී පැළ ආසාදනය වීම වැළැක්වීමට එම ස්ථානයේ පස පුළුස්සා දමන්න.

3.6.4. රසායනික පළිබෝධ පාලනය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත තෝරාගත් බෝග - පළිබෝධ සංයෝජනයට අනුව පළිබෝධනාශක ආරක්ෂිතව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතය පළිබෝධනාශක කළමනාකරණය ලෙස හැඳින්වේ. ඒකාබද්ධ පළිබෝධ පාලනයට අදාල සෙසු සියළුම ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පසු ද පළිබෝධ මර්දනය සිදු නොවන්නේ නම් පමණක් අවසන් විකල්පය ලෙස පළිබෝධනාශක භාවිතය සිදුකළ යුතුය. මෙහිදී පළිබෝධනාශකවලින් සෞඛ්‍යයට සිදුවන අනතුරුදායක බලපෑම අවම කර ගනිමින් හා පාරිසරික උපද්‍රව අවම වන අයුරින් භාවිතය පිළිබඳ සැළකිලිමත් විය යුතුය.

පළිබෝධනාශක වර්ගය, ස්වභාවය, රසායනික කාණ්ඩය, ක්‍රියා කරන ආකාරය හා විෂ මට්ටම අනුව පළිබෝධනාශක වර්ගීකරණය කර තිබේ. මීයන් යොදා ගනිමින් සිදු කරන ලද අධ්‍යයනයන් තුළින් පළිබෝධනාශකවල LD_{50} අගය මත පදනම් වූ හානිය ගැන සලකා ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් පළිබෝධනාශක වර්ගීකරණයක් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව පළිබෝධනාශක බෝතලයේ හෝ ඇසුරුමේ ඇති වර්ණවත් දාරයක් මඟින් විෂ මට්ටම පෙන්වා දී තිබේ. පළිබෝධනාශකවල

මිනිසාට ඇති විෂ මට්ටම්වල තීව්‍රතාවය වැඩිම ඒවායේ සිට අඩුම ඒවා දක්වා හැඳින්වීමට පිළිවෙලින් රතු, කහ, නිල්, කොළ වර්ණ දාර පළිබෝධනාශක ලේබල් මත පහළින් ඇතුළත් කර ඇත. ඒ අනුව ප්‍රායෝගිකව හැකි සෑම අවස්ථාවකම අඩුම විෂ සහිත පළිබෝධනාශක බෝගවලට යෙදීම සඳහා තෝරා ගත යුතුය.

රූපය 29. පළිබෝධනාශක ලේබලයේ වර්ණ දාර

රූපය 30. වර්ණ දාර සහිත පළිබෝධනාශක ඇසුරුම්

පළිබෝධනාශක භාවිතයේ දී සැළකිලිමත් විය යුතු කරුණු

බෝග නිෂ්පාදනයක තිබිය හැකි උපරිම පළිබෝධනාශක අවශේෂ ප්‍රමාණයට (MRL - Maximum Residue Limit) වඩා අඩු මට්ටමකින් පළිබෝධනාශක මට්ටම පවත්වා ගැනීම තුළින් සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදනයක් ලබාගත හැක.

පළිබෝධනාශක භාවිතයට අදාළව සේවක සේව්‍ය දෙපක්ෂයටම අයත් සෑම පුද්ගලයෙකුටම තම තමන්ගේ වගකීම සම්බන්ධයෙන් හොඳ පුහුණුවක් ලබා දිය යුතුය.

නිර්දේශිත පළිබෝධනාශක

නිර්දේශිත කාලාන්තරවලින්, නිර්දේශිත ප්‍රමාණවලින්, නිර්දේශිත කාර්යයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පළිබෝධනාශක පමණක් භාවිතා කරන්න.

එකම රසායනික ක්‍රියාකාරීත්වය සහිත පළිබෝධනාශක එක් කෂේත්‍රයක් සඳහා අඛණ්ඩව භාවිතා නොකළ යුතුය. එක් එක් පළිබෝධනාශකයට අදාල ක්‍රියාකාරීත්වය ලේබලයේ රතු අකුරින් සඳහන් කර ඇත.

පළිබෝධනාශක භාවිතා කිරීමට පෙර එහි ලේබලයේ ඇති උපදෙස් හොඳින් කියවා ඒ අනුව පළිබෝධනාශක යෙදීමට කටයුතු කරන්න. නිෂ්පාදනය පිළිබඳ විස්තර (සක්‍රීය ද්‍රව්‍ය, සංයෝජන ආකාරය) පළිබෝධනාශක ක්‍රියාකාරීත්වයට අදාල කේතය, භාවිතා කිරීම සඳහා උපදෙස් (බෝගය, ඉලක්ක පළිබෝධකයින්, යෙදිය යුතු මාත්‍රාව, කාලාන්තරය, යෙදිය යුතු අවස්ථාව, පෙර අස්වනු කාලය හා ප්‍රථමාධාර) අදාල ලේබලයේ අන්තර්ගත කර ඇත.

බෝග අස්වනු නෙළීමේ දී ඒ ඒ පළිබෝධනාශකයට අදාල පෙර අස්වනු කාලයට පසුව අස්වනු නෙළීම සිදු කිරීම අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු කරුණක් වේ.

01. පළිබෝධනාශක මිශ්‍ර කිරීම හා යෙදීම

පළිබෝධනාශක ඉසින උපකරණ සෑම යෙදීමකටම පෙර නිවැරදිව ක්‍රමාංකනය කර ගත යුතුය. පළිබෝධනාශක ඉසින උපකරණ හොඳ තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා ඒවා හොඳින් නඩත්තු කරන්න. ඉසින යන්ත්‍රවල (ස්ප්‍රේ යන්ත්‍ර) යම් දෝෂයක් තිබේදැයි පරීක්ෂා කර එවැන්නක් ඇත්නම් නිවැරදි කරන්න. මේ සම්බන්ධයෙන් වාර්තා තබා ගන්න.

ස්ප්‍රේ යන්ත්‍රයෙන් පළිබෝධනාශක කාන්දු වීමක් සිදුවේ නම් වහාම අළුත්වැඩියා කරන්න. පළිබෝධනාශක දියර වෑස්සෙන ස්ප්‍රේ යන්ත්‍ර භාවිතා කිරීම නිසා එක් අතකින් පළිබෝධනාශක අපතේ යන අතර එය ක්ෂේත්‍ර යන්ත්‍ර ක්‍රියාකරු කෙරෙහි මහත් අවදානමක් ඇති කරයි. එහෙයින් දෝෂ සහිත හෝ වෑස්සීම් සහිත ස්ප්‍රේ යන්ත්‍ර භාවිතා නොකළ යුතුය.

ඉසීමට භාවිතා කරන පළිබෝධනාශක වර්ගය අනුව නිර්දේශිත නොසලය/නොසල භාවිතා කරන්න.

නොසල පිරිසිදු කිරීම සඳහා ජලය හෝ නොසලයේ සිදුරට හානි නොවන දෙයක් භාවිතා කරන්න. කිසිම විටක අවහිර වී ඇති නොසලයක් පිරිසිදු කිරීම සඳහා කටින් පිඹීම නොකළ යුතුය.

පළිබෝධනාශක මිශ්‍ර කිරීමේ දී හා ඉසීමේ දී අනිවාර්යයෙන්ම පුද්ගලික ආරක්ෂක ඇඳුම් හා උපකරණ (රබර් අත් වැසුම්, රබර් පාවහන්, මුව ආවරණ, අංග සම්පූර්ණ මුහුණු ආවරණ, අත් දිග උඩු කබා හා අනෙකුත් ආරක්ෂිත ඇඳුම්) පැළඳීම කළ යුතුය.

සාන්ද්‍ර පළිබෝධනාශකය විසිරීම හෝ අත්වල තැවරීම වැළැක්වීමට අත් ආවරණ සහ ඒවා මැනීම සඳහා මිනුම් කෝප්පයක් හෝ සිලින්ඩරයක් භාවිතා කරන්න.

පළිබෝධනාශක මිශ්‍ර කිරීම සඳහා පිරිසිදු ජලය භාවිතා කරන්න.

පළිබෝධනාශක බෝතලයේ/ භාජනයේ ඇති පළිබෝධනාශක සම්පූර්ණයෙන්ම භාවිතා කොට අවසන් වූ පසු බෝතලය/ බඳුන තුන් වරක් ජලයෙන් සෝදා සේදූ ජලය ඉසින මිශ්‍රණයටම එකතු කරන්න.

පළිබෝධනාශක ඉසීමේ දී ඒවාට නිරාවරණය වීම අවම කර ගැනීම සඳහා නිර්දේශිත ආරක්ෂිත ඇඳුම් හා උපකරණ භාවිතා කරන්න.

පළිබෝධනාශක ඉසීමේ දී සුළං හමන දිශාවට ලම්බක දිශාවට ගමන් කරමින් ඉසීම සිදු කරන්න.

ශාකයක තුරු වියනේ ඇතුළත කොටසට පළමුව පළිබෝධනාශක ඉස, ඉන් පසු තුරු වියනේ පිටතට ඉසින්න.

පළිබෝධනාශක අවශේෂ වැඩිපුර රැඳීමත්, ක්‍රියාකරුවන් පළිබෝධනාශක වලට වැඩියෙන් නිරාවරණය වීමත්, අධික පරිසර දූෂණයක් සිදු වීමත් යන කාරණා නිසා

බලවේග ඉසින යන්ත්‍ර (පවර් ස්ප්‍රේයර්) අත්‍යාවශ්‍ය අවස්ථා වලදී පමණක් භාවිතා කරන්න.

යෙදූ පළිබෝධනාශකය, යොදන ලද පළිබෝධනාශක ප්‍රමාණය, යොදන ලද වගා ප්‍රමාණය, යොදන අවස්ථාවේ පැවති කාළගුණික තත්ත්වය (සුළඟේ වේගය, වැස්ස ආදී) යෙදූ දිනය සහ ක්‍රියාකරුගේ නම ආදී පළිබෝධනාශක යෙදීමට අදාල විස්තර පිළිබඳ වාර්තා තබා ගන්න.

පළිබෝධනාශක ඉසින අතරේ ආහාර පාන ගැනීම, දුම්පානය හෝ බුලත්විට සැපීම නොකළ යුතුය.

හදිසි අනතුරකදී හෝ පළිබෝධනාශක භාවිතයෙන් පසු ඔබට යම් අපහසුවක් දැනේ නම්, වහාම වෛද්‍යවරයකු වෙත යොමුවන්න. (ලේබලය සහ ඇසුරුම ඔහුට පෙන්වන්න)

පළිබෝධනාශක ඉසීමෙන් පසු පිරිසිදු ජලයෙන් හොඳින් සේදීමෙන් ස්ප්‍රේ යන්ත්‍ර පිරිසිදු කරන්න.

ස්ප්‍රේ යන්ත්‍ර සේදූ ජලය ජල මාර්ගවලට දැමීම නොකළ යුතුය.

පළිබෝධනාශක ඉසීම අවසන් වූ වහාම ඉසීමේදී පැළඳ සිටි ඇඳුම් මාරු කර දෙඅත් සබන් දමා ජලයෙන් සෝදා අනතුරුව සබන් ගා ස්නානය කරන්න.

ඉසීම සඳහා භාවිතා කළ ඇඳුම් සේදුම්කාරක අඩංගු ජලය තුළ ගිල්වා තබා සෝදා හොඳින් වේලා ගන්න. අනෙක් සාමාන්‍ය ඇඳුම් සමඟ මිශ්‍ර කර මෙම ඇඳුම් සේදීමෙන් වළකින්න.

02. පළිබෝධනාශක ගබඩා කිරීම

මුල් ලේබලය සහිත භාජනයේම පළිබෝධනාශක ගබඩා කර තබන්න.

අගුල් දැමිය හැකි කාමරයක හෝ කබඩ් එකක පළිබෝධනාශක ගබඩා කර, කුඩා ළමයින්ට ළඟා විය නොහැකි ලෙස අගුළු ලා තබන්න.

ආහාර හෝ ආහාර ද්‍රව්‍ය අඩංගු බෝතල් සමඟ එකට පළිබෝධනාශක බෝතල් නොතැබිය යුතුය.

පළිබෝධනාශක, ලාම්පු, ගිනිදැල් හා ගින්දරවලින් ඈත් කර තබන්න. දියර පළිබෝධනාශකවල ගිනි ඇවිලිය හැකි ද්‍රාවක අඩංගු විය හැකි නිසා ගින්දර ළඟ තැබීමෙන් අනතුරු සිදු වීමට ඉඩ ඇත.

අත්වල තැවරීම වැළැක්වීම සඳහා භාවිතා කර ඉතිරි වූ පළිබෝධනාශක බෝතල් ඝන ප්ලාස්ටික් බෑග් එකක දමා තබන්න.

පළිබෝධනාශක දැමූ බෝතල් ආහාර හෝ ආහාර ද්‍රව්‍ය දැමීම ආදී වෙනත් කාර්යයන් සඳහා නැවත පාවිච්චි නොකරන්න.

03. හිස් පළිබෝධනාශක බඳුන් බැහැර කිරීම

හිස් පළිබෝධනාශක බෝතල්, පැකට්ටු හා කඩදාසි පෙට්ටි, නිවැරදිව බැහැර කරන තුරු ආරක්ෂිතව ගබඩා කර තබන්න.

හිස් පළිබෝධනාශක භාජන ගිනි තැබීමෙන් හෝ පලුදු කිරීමෙන් වළකින්න.

හිස් පළිබෝධනාශක ඇසුරුම් පිළිගත් ක්‍රමවේදයකට පමණක් බැහැර කිරීම කළ යුතුය.

04. කෘෂි නිෂ්පාදනවල ඇති රසායනික ද්‍රව්‍යවල අවශේෂ මට්ටම් පරීක්ෂා කිරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශයට අනුකූලව නිවැරදිව පළිබෝධනාශක ඉසීම කර ඇත්දැයි දැන ගැනීම සඳහා අහඹු ලෙස තෝරාගත් බෝග නිෂ්පාදන තොග පළිබෝධනාශක අවශේෂ සඳහා පරීක්ෂා කර බැලීම සුදුසුය. එසේම බැරලෝහවල අවශේෂ මට්ටම ද පරීක්ෂා කර බැලිය යුතුය.

මෙම අවශේෂ මට්ටම් විශ්ලේෂණය කර බැලීම සඳහා යොදා ගන්නා පරීක්ෂණාගාරය රටේ පිළිගත් නීත්‍යානුකූලව බලය පැවරූ ආයතනයකින් සහතික කළ එකක් විය යුතුය. (ප්‍රතීතනය ලැබූ විද්‍යාගාර)

උපරිම අවශේෂ මට්ටම් ඉක්මවා පළිබෝධනාශක හා බැරලෝහ ඇති බවට හඳුනා ගතහොත් හෝ යම් වෙළඳපොලක අවශ්‍යතාවයන්ට වඩා අවශේෂ අඩංගු බවට තීරණය කළහොත් එම අදාල බෝග නිෂ්පාදන තොගය වෙළඳපොලට යැවීම හෝ පිටරට යැවීම නතර කළ යුතුය.

අවශේෂ මට්ටම් උපරිම සීමාවන් ඉක්මවා අඩංගු වීමට හේතු පරීක්ෂා කර බලා නැවතත් එවැන්නක් සිදු නොවීමට ක්‍රියා මාර්ග හා උපාය මාර්ග අනුගමනය කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් අදාල වාර්තා තබා ගැනීම අවශ්‍ය වේ.

3.7 අස්වනු නෙළීම හා පශ්චාත් අස්වනු හැසිරවීම

අස්වනු නෙළීම

නියමිත පරිණතියේ දී අස්වනු නෙළීම වැදගත් වේ. නියමිත අවස්ථාවට වඩා වැඩියෙන් මෝරා ඇති විට අස්වනු නෙළීමෙන් ගෙඩි පැළීම, ප්‍රවාහනය කරන කාලසීමාව තුළදී ගෙඩි ඉදීමට ලක්වීම, අස්වනු නෙළීමේදී යාන්ත්‍රික හානි සිදුවීම, ප්‍රවාහනයේ දී කෙසෙල් ගෙඩි මතුපිට සීරීම් හා තැලීම් ඇතිවීම සිදු වේ.

එබැවින් ආකර්ෂණීය පෙනුමකින් හා ඉහළ ගුණාත්මයෙන් යුත් නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා පූර්ව හා පසු අස්වනු පරිහරණය පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

අස්වනු නෙලන අවස්ථාව - කෙසෙල් කැනක් හටගත් දිනයේ සිට සුදුසු තත්ත්වයට මේරීමට ගතවන කාලය වගා කරන

කෙසෙල් ප්‍රභේදය අනුව පහත දක්වා ඇති පරිදි වෙනස්වේ. ඒ අනුව අස්වනු නෙලන අවස්ථාව තීරණය කළ යුතුය.

කෙසෙල් වර්ගය/ ප්‍රභේදය	මේරීමට ගතවන කාලය
ආනමාළු හා ඇඹිබන්	මාස 3
ඇඹුල්	මාස 3 සති 1
කෝලිකුට්ටු	මාස 4
සීනි කෙසෙල්	මාස 4 සති 2
පූවාලු	මාස 5

පවතින කාළගුණික තත්ත්ව අනුව ඉහත කාල සීමාවන් සුළු වශයෙන් වෙනස්විය හැක.

පුද්ගලයන් දෙදෙනෙකු එකතුවී කෙසෙල් කැන් කැපීමෙන් ගෙඩි තුවාලවීම වළක්වා ගත හැකිය. හොඳින් කැපෙන මුවහත් පිහියක් කෙසෙල් කැන් කැපීම සඳහා භාවිතා කළ හැක.

කෙසෙල් වර්ගය අනුව ලබාගත හැකි අස්වනු ප්‍රමාණ

කෙසෙල් වර්ගය/ ප්‍රභේදය	සාමාන්‍ය පාලන තත්ත්ව යටතේදී කි.ග්‍රෑ.	උසස් පාලන තත්ත්ව යටතේදී කි.ග්‍රෑ.
ඇඹුල්	15	20-22
ඇඹිබන්	18	25-30
ආනමාළු	15	20
අළු කෙසෙල්	12	15-18
සීනි කෙසෙල්	16	20-22

සූර්යාලෝකයට නිරාවරණය වීමෙන් වළක්වා ගැනීමට හැකි තරම් ඉක්මනින් නෙලූ අස්වැන්න ක්ෂේත්‍රයෙන් ඉවත් කරගත යුතුයි. නෙලූ අස්වැන්න ක්ෂේත්‍රයෙන් ඉවතට ගෙන යාමට ප්‍රමාද වන්නේ නම් සෙවණ ඇති ස්ථානයක තාවකාලිකව ගබඩා කර තැබිය යුතුය.

කෙසෙල් කැන් කෙලින්ම පස් සමඟ නොගැටෙන සේ තබන්න. අස්වැන්න හැසිරවීමේදී, ඇසිරීමේදී, තාවකාලිකව ගබඩා කර තැබීමේදී පොළව සමඟ ස්පර්ශ වීමෙන් වලක්වා ගැනීම අවශ්‍ය වේ.

විශේෂයෙන් අස්වනු නෙලන කාලයේදී ගෘහාශ්‍රිත හා ගොවිපල සතුන් නිෂ්පාදන ක්ෂේත්‍ර වලින් ඉවත් කර තබන්න. එසේම මෙවැනි සතුන් බෝග නිෂ්පාදන නෙලීමට, තේරීම, ඇසිරීම හා ගබඩා කර තබන ස්ථාන වලට ඇතුල්වීම ද වැළැක්විය යුතුය.

බෝග නිෂ්පාදන හැසිරවීම, තේරීම, ඇසිරීම හා ගබඩා කර තබන ස්ථාන හා ඒ අවට ප්‍රදේශ පළිබෝධ වලින් තොරව පවත්වා ගැනීමට කටයුතු කරන්න.

පළිබෝධ පාලනය සඳහා ඇම හා උගුල් තැබීමේ හා නඩත්තු කිරීමේදී බෝග නිෂ්පාදනයන් හා ඇසිරීමේ බඳුන් හා ද්‍රව්‍ය ඒවා නිසා දූෂණය වීමට තිබෙන ඉඩකඩ අවම වන පරිදි ක්‍රියා කරන්න. ඇම හා උගුල් තබන ස්ථාන ගැන වාර්තා තබා ගන්න.

තේරීම, වර්ග කිරීම, ඇසිරීම ආදී කටයුතු සඳහා අස්වනු තැබීමට භාවිතා කරන කළාල, පැදුරු හෝ එවැනි වෙනත් දෑ වල

පිරිසිදු බව, රසායනික ද්‍රව්‍ය තැවරී තිබීම, ආගන්තුක ද්‍රව්‍ය තිබීම හා පළිබෝධකයින් සිටීම ආදිය පිළිබඳ ඒවා භාවිතා කිරීමට පෙර පරීක්ෂා කර බලන්න. අවශ්‍ය නම් භාවිතයට ගැනීමට පෙර පිරිසිදු කරන්න.

මෙම භාවිතා කරන ද්‍රව්‍ය නිසා නිෂ්පාදනය දූෂිත වීමට යම් අවදානමක් තිබේ නම් ඒවා භාවිතයෙන් වලකින්න.

තේරීම හා වර්ග කිරීම

යාන්ත්‍රික හානි හා පළිබෝධ හානි නිසා ඇති වූ කැලැල් සහිත ගෙඩි, දුර්වර්ණ වූ ගෙඩි, විකෘති වූ ගෙඩි, කුඩා ගෙඩි, නොමේරූ ගෙඩි හා ප්‍රමාණය ඉක්මවා ඉදුනු ගෙඩි සහිත ඇවරි ඉවත් කර වෙළඳපොලට යොමු කළ හැක.

අනුරේඛනය

නිෂ්පාදන කුමන ගොවිපලෙන් කුමන කොටසකින් නිෂ්පාදනය කරන ලද්දක් දැයි පසු විපරම්කර බැලීමට හැකි වීම අනුරේඛනය මඟින් බලාපොරොත්තු වේ.

ඒ සඳහා ගොවිපලේ සෑම කෙසෙල් නිෂ්පාදන ක්ෂේත්‍රයක්ම නමකින්, සංකේතයකින්, අංකයකින් හැඳින්වීමට කටයුතු කරන්න. මෙම නම් හෝ සංකේත ගොවිපලේ පිහිටීම් සිතියමේ සටහන් කරන අතර එක් එක් නිෂ්පාදන ඒකකයක් තුළ ද එහි නම, සංකේතය හෝ අංකය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ හැකිය.

ඒ ඒ නිෂ්පාදන ඒකකයෙන් නෙලූ අස්වනු කෙදිනක, කුමන වෙළඳපොලකට යවනු ලැබුවේදැයි වාර්තාවක් තබා ගන්න.

යම් බෝග නිෂ්පාදන තොගයක් දූෂණය වී තිබෙනු හෝ දූෂණය වී තිබීමට ඉඩ ඇති බවට හඳුනා ගතහොත් එම තොගය වෙන් කර බෙදා හැරීම වළක්වන්න. මේ වන විටත් එබඳු යම් බෝග නිෂ්පාදන තොග යක් විකුණා ඇත්නම් මිලදී ගත් පුද්ගලයාට වහාම දැනුම් දී තවදුරටත් බෙදා හැරීම නතර කරන්න.

යම් බෝග නිෂ්පාදන තොගයක් දූෂණය වී ඇති හේතුව පරීක්ෂා කර බලා එවැනි දූෂණය වීමක් නැවත සිදුවීම වළක්වා ගැනීමට නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග අනුග මනය කරන්න. දූෂණය වීමට හේතු හා ඒවා නිවැරදි කිරීමට අනුගමනය කළ ක්‍රියා මාර්ග ගැන වාර්තා තබා ගන්න.

ප්‍රවාහනය කිරීම

යාන්ත්‍රික හානි අවම කිරීම සඳහා කෙසෙල් ඇසුරූ භාජන ආරක්ෂාකාරීව ප්‍රවාහනය කරන්න.

සෘජු සූර්යාලෝකයෙන් හා වර්ෂාවෙන් ආරක්ෂා කරගෙන හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි ප්‍රවේශමෙන් වෙළඳපොල කරා නිවැරදිව ඇසුරූ තොග ප්‍රවාහනය කරන්න.

පිරිසිදු බව, රසායනික ද්‍රව්‍ය විසිරී තිබීම, ආගන්තුක ද්‍රව්‍ය තිබීම හා පළිබෝධකයින් සිටීම ආදී කරුණු පිළිබඳව කෙසෙල් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා වාහන පූර්ව පරීක්ෂාවකට භාජනය කරන්න. බෝග නිෂ්පාදන දූෂණය වීමේ අවදානමක් තිබෙන බවට හැඟී ගියහොත් බෝග තොග පැටවීමට පෙර හොඳින් පිරිසිදු කරන්න.

තට්ටු වශයෙන් ඇසිරීමේ දී තට්ටු හතරකට වඩා උසකට ලොරියේ කැන් ඇසිරීම සුදුසු නොවේ.

රසායනික, ජීව විද්‍යාත්මක හෝ භෞතිකව කෙසෙල් තොග දූෂණය වීමට විභවයක් තිබෙන භාණ්ඩ හා ද්‍රව්‍ය වලින් වෙන් කර ඇසුරූ තොග පටවා ප්‍රවාහනය කරන්න.

ගබඩා කිරීම

ඇසුරුම් ද්‍රව්‍ය ගබඩා කිරීමේදී, මීයන්, කුරුල්ලන්, ගොවිපල සතුන්, ගෘහාශ්‍රිත සතුන් හා භෞතිකව හා රසායනිකව දූෂණය විය හැකි ද්‍රව්‍ය වලින් තොරව ඇසුරුම් ද්‍රව්‍ය ගබඩා කර තිබිය යුතුය.

වඩා සුදුසු අවස්ථාවේදී අස්වනු නෙලාගත් විට කාමර උෂ්ණත්වය යටතේ දින 7-8 පමණ කාලයක් කොළ පැහැති තත්ත්වයෙන්ම තබා ගත හැකිය.

උෂ්ණත්වය $12^{o}C$ - $13^{o}C$ හා සාපේක්ෂ ආර්ද්‍රතාවය 80 - 85% සහිත ශීත කාමරවල දින 30 පමණ කාලයක් ගබඩා කළ හැක.

කෙසෙල් ඉදවීම

දේශීය තත්ත්ව යටතේ කෙසෙල් අස්වැන්න නෙලීමෙන් පසු, දින 3-4 කින් පමණ ස්වභාවිකව ඉදීම සිදු වෙයි. කෘත්‍රිමව ඉදවා ගැනීම සඳහා රසායනික ද්‍රව්‍ය (එත්රල්) භාවිතා කරයි. ඒ සඳහා නිවැරදි නිර්දේශිත ක්‍රමවේදය පමණක් භාවිතා කළ හැකිය.

එත්‍රැල් භාවිතා කර කෙසෙල් ඉදවීමේදී වායු හුවමාරුව සිදු නොවනසේ වැසිය හැකි හෝ ආවරණය කළ හැකි බඳුනක්, පෙට්ටියක් හෝ කාමරයක් තුළ එහි පරිමාවෙන් 1/5 ක නිදහස් අවකාශයක් තිබෙන ලෙස නියමිත පරිදි මේරූ කෙසෙල් ඇවරි හෝ කැන් ඇසිරීම සිදු කරන්න.



රූපය 31. ඉදවීමට භාවිතා කරන කුටීරය/ කාමරය

කුටීරයේ දොර හොඳින් වසා තබන්න. මෙම දොර වායු හුවමාරුව සිදුනොවන පරිදි වායුරෝධනය (seal) විය යුතුය. එමෙන්ම, පී.වී.සී. බටයකින් පිටත සිට කුටීරය තුළට හුණු දියර දැමීමට හැකිවන පරිදි ඇටවුමක් සකසා ගත යුතුය.

පහත ද්‍රාවණ දෙක වෙන වෙනම සාදා ගන්න.

එත්‍රැල් ද්‍රාවණය සාදා ගැනීම

එත්‍රැල් මිලිලීටර 01 ක් ගෙන එය ජලය ලීටරයක දියකර එත්‍රැල් ද්‍රාවණය සාදා ගත යුතුය.

හුණු ද්‍රාවණය සාදා ගැනීම

දියගැසූ හුණු ($Ca(OH)_2$) ග්‍රෑම් 10 ක් ජලය ලීටරයක දියකර හුණු ද්‍රාවණය සාදා ගත යුතුය.

කාමරයේ/ කුටියේ පරිමාව ඝන අඩි 1 ක් සඳහා සාදාගත් එත්‍රැල් ද්‍රාවණයෙන් මිලි ලීටර 3-5 ක් වනසේ, කාමරයේ පරිමාවට අදාලව අවශ්‍ය එත්‍රැල් ප්‍රමාණය ගණනය කර ගත යුතුය.

කුටීරයේ පරිමාව අනුව සාදාගත් එත්‍රැල් ද්‍රාවණය ප්ලාස්ටික් හෝ මැටි බඳුනක දමා කුටීරයේ කෙළවරක තබන්න.

සාදාගත් හුණු දියර, දිය කරගත් එත්‍රැල් දැමූ ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් පුනීලයක ආධාරයෙන් පී.වී.සී. බටයකට දැමීමෙන්, හුණු දියර එත්‍රැල් භාජනයට වැටීමට සලස්වන්න. ඉන්පසු හැකි ඉක්මනින් පී.වී.සී. බටයේ කට වසා තබන්න. (එන්ඩ් කැප් එකක් මඟින්)

පැය 24 ක කාලයක් ඉහත පරිදි ආවරණය කර තබා, ඉන්පසු තවත් දින දෙකක් හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි කුටීරය නිරාවරණය කර තබන්න. එමඟින් හොඳින් ඉදුනු ගුණාත්මක කෙසෙල් ගෙඩි ලබා ගත හැකිය.

පලතුරු කෘත්‍රිමව ඉදවීමේදී සැලකිය යුතු කරුණු

කිසිවිටෙකත් නොමේරූ පලතුරු භාවිතා නොකරන්න.

එත්රල් හා හුණු දියර වෙන වෙනම සාදා තබා ගත යුතුය. මිශ්‍ර කිරීම කළ යුතු වන්නේ ඉදවීමේ කුටීරය තුළ දී පමණි.

කුටීරයේ දොර විවෘත කිරීම කළ යුත්තේ පැය 24 ක කාලයකට පසුවය. ඒ වන විට පලතුරු ඉදී නොමැති වුවද දොර ඇර නැවුම් වාතය ලැබීමට සලස්වන්න.

කුටීරයෙන් එළියට ගත් විගස පලතුරු වෙළඳපොලට ප්‍රවාහනය කළ යුතුය.

3.8 සේවක සෞඛ්‍යය, ආරක්‍ෂාව හා සුබසාධනය

01. ආරක්ෂිත හා යහපත් සේවා තත්ත්වයක් ගොවිපල තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුමක් අනුව කටයුතු කිරීම වැදගත් වේ.

02. හැකි සෑම විටම සේවකයන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය හා සුභසාධන පහසුකම් සැලසීමට කටයුතු සිදු කිරීම යහපත් කෘෂි පිළිවෙත් යටතේ එන ප්‍රධාන අංගයකි.

ගොවිපල සේවකයින් හට පුද්ගල සෞඛ්‍ය ආරක්‍ෂාව පවත්වා ගැනීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබිය යුතුය. ඒ සඳහා පුද්ගල සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම පිළිබඳව

මනා පුහුණුවක් ඔවුන්හට ලබා දීමට කටයුතු කළ යුතු අතර එවැනි පුහුණු ලබාදීම් සම්බන්ධයෙන් සටහන් තබා ගැනීම වැදගත් වේ.

පුද්ගල සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම පිළිබඳ උපදෙස් ලිඛිතව පත්‍රිකාවක් ආධාරයෙන් ලබාදීම හා සුදුසු ස්ථානවල පැහැදිලිව ප්‍රදර්ශනය කිරීම සිදු කිරීම කළ හැකිය.

සේවකයින් සඳහා ආරක්ෂිත ඇඳුම් පැලඳුම් ලබාදීමත් ශ්‍රමිකයින් සඳහා වැසිකිළි හා අත් සේදීමේ පහසුකම් සපයා ගැනීමට අවස්ථාව සැලසීමත් සිදුකළ යුතුය.

නැවුම් බෝග නිෂ්පාදන සමඟ කෙලින්ම ස්පර්ශ වන පරිදි සිදු කෙරෙන වැඩ සඳහා රෝගී ශ්‍රමිකයින් නොයෙදීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය.

ගොවිපල හිමිකරුවන් හා සේවකයින්ගේ විවිධ කාර්යයන්ට අදාලව යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වලට සම්බන්ධ වගකීම් පිළිබඳව පුහුණු වරින් වර ලබාදිය යුතු අතර ඊට අදාලව වාර්තා තබා ගැනීම කළ යුතුය.

පෞද්ගලික සෞඛ්‍ය ආරක්ෂාව හා උපකරණ භාවිතය පිළිබඳව ද, විශේෂයෙන් පළිබෝධනාශක භාවිතය හා යෙදීම පිළිබඳ පුහුණු ලබාදිය හැකිය.

හදිසි අවස්ථාවක දී ප්‍රතිකාර කළ හැකි පරිදි ප්‍රථමාධාර පෙට්ටියක් ගොවිපල තුළ හෝ ආසන්නයේ ලඟාවීමට පහසු නිශ්චිත ස්ථානයක් තැබීම කළ යුතුය.

සියලුම රැකියා තත්ත්වයන් ජාතික මට්ටමේ හෝ ප්‍රාදේශීය නීති රීතිවලට අනුකූලවීම වැදගත් වේ.

ගොවිපල සේවකයින් සඳහා අවශ්‍ය අවස්ථාවලදී වෛද්‍ය පරීක්ෂණ පහසුකම් ලබාගැනීමට යොමු කිරීමට කටයුතු කළ යුතු වේ.

3.9 ලේඛන හා වාර්තා තබා ගැනීම

අනුරේඛණය කිරීමේ හැකියාව ඇති පරිදි ලේඛන නඩත්තු කිරීම එනම් නිෂ්පාදනය මූලිකවම සිදුකරන ලද ගොවිපල දක්වාම අනුරේඛණය කිරීමේ හැකියාව තිබෙන පරිදි ලේඛන පවත්වා ගැනීම අවශ්‍ය වේ.

SL-GAP සහතිකකරණය සඳහා සකසන ගොවිපලක අවශ්‍ය කරන වාර්තා නඩත්තු කිරීම අනිවාර්යය වේ. බිම් සැකසීමේ සිට නිෂ්පාදන බෙදා හරින අවස්ථාව දක්වා අදාළ සියලු ක්‍රියාකාරකම් සඳහා වාර්තා තබා ගැනීම වැදගත් කරුණකි.

3.9.1. ගොවිපල තත්ත්ව කළමනාකරණ සැලැස්ම (Quality Management Plan for the Farm)

ගොවිපල පවත්වාගෙන යාමේ දී සිදුකිරීමට සිදුවන සියලුම වැදගත් කරුණු සැලසුම් කිරීම හා වාර්තාවක් ලෙස සකස් කිරීම මෙහිදී සිදුකෙරේ.

මෙමඟින් ගොවිපලේ සිදුකිරීමට නියමිත ක්‍රියාකාරකම් ක්‍රමවත්ව හා විධිමත්ව සිදු

කිරීමට හැකිවන අතර වගාවේ ගුණාත්මය රැකෙන පරිදි අවශ්‍ය පියවර ගැනීමට ද හැකිවනු ඇත.

තත්ත්ව කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ දී පහත කරුණු පිළිබඳ සැළකිලිමත් වෙමින් සැලසුම් කිරීම සිදුකළ හැකිය.

a. බෝග වගා සැලැස්ම

ඉදිරියේ දී වගා කිරීමට බලාපොරොත්තු වන පළමු හා දෙවන කන්න සඳහා වන බෝග වගා සැලැස්ම සැකසීම (බෝගය/ප්‍රභේදය, වපසරිය, වගා කාල රාමුව ආදී කරුණු ඇතුළත්ව).

කෙසෙල් වගාවේදී ඉදිරි වර්ෂය සඳහාම සැකසිය හැක.

b. පොහොර නිර්දේශ හා යොදන ආකාරය

වගා කිරීමට බලාපොරොත්තු වන බෝග සඳහා/ කෙසෙල් වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රමාණවලට අනුකූලව පොහොර යෙදිය යුතු අතර යොදන ආකාරය ලිඛිතව සටහන් කර තිබීම.

c. පළිබෝධ පාලනය

වගා කිරීමට බලාපොරොත්තු වන බෝගය/ කෙසෙල් වගාව සඳහා ඇතිවිය හැකි යැයි සිතන පලිබෝධ හා ඒවා වළක්වා ගැනීමට අදාළව ගතහැකි පිළියම් ආදී විස්තර ඇතුළත් කිරීම. යොදාගත හැකි ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම සටහන් කිරීම.

d. අවධානම් තත්ත්ව කළමණාකරණ සැලැස්ම

ගොවිපලෙහි අවධානම් තත්ත්ව හඳුනා ගැනීම, ඒවා කළමණාකරණය කිරීම සඳහා සැලැස්ම හා ගත් පියවර පිළිබඳ විස්තර.

e. වෙනත්

වගාවේ මෙන්ම අස්වැන්නේ ගුණාත්මය පවත්වා ගැනීම සඳහා යොදාගත හැකි අනෙකුත් ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම (ජල සම්පාදන ක්‍රම, ජල හා පාංශු පරීක්ෂණ, අස්වනු නෙලීම, පසු අස්වනු ක්‍රියා හා පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදී ක්‍රියාකාරකම් අඩංගු කළ සැලැස්ම).

ගොවිපල සැලසුම, හැකිතාක් ස්ථිර සැලැස්මක් ලෙස පවත්වා ගැනීම වඩා සුදුසු නමුත් අවශ්‍ය විටක දී වෙනස්කම් කළ හැකි වේ. ගොවිපල සැලැස්මේ පසුව සිදුකළ වෙනස්කම් වේ නම්, ඒ පිළිබඳව SL-GAP සහතිකකරණ අංශයට දැනුම්දීමක් සිදුකළ යුතුය.

සහතිකකරණය සඳහා ඔබගේ ගොවිපල පරීක්ෂා කරන විට, ගොවිපල තත්ත්ව කළමනාකරණ සැලැස්මේ අඩංගු කරුණු SL-GAP ප්‍රමිතීන්ට ගැලපෙන්නේ ද යන්න පිළිබඳව මූලිකව තහවුරු කර ගැනීමක් සිදුකරගත හැක. මෙහිදී යම් අනනුකූලතාවයක් හඳුනාගත් විට එය නිවැරදි කිරීම සඳහා උපදෙස් ලැබෙනු ඇත.

ඉදිරි වසරක කාලයක් සඳහා SL-GAP සහතිකය ලබාදෙන බැවින් අවම වශයෙන් වසරක කාලයක් සඳහා ගොවිපල තත්ත්ව කළමණාකරන සැලැස්මක් සැකසීම ඉතා වැදගත් කරුණකි.

නිවැරදිව සැකසූ බෝග වගා සැලැස්මෙහි පිටපතක් අයදුම්පත සමඟ අමුණා එවීම මඟින් එම බෝග සහතිකයට ඇතුළත් කරගත හැකිය.

3.9.2. බෝග වාර්තා නඩත්තුව (Maintenance of crop records)

බිම් සැකසීමේ සිට නිෂ්පාදන බෙදා හරින අවස්ථාව දක්වා ගොවිපලේ සිදුකරනු ලබන එක් එක් බෝගයට අදාළ සියලුම ක්‍රියාකාරකම් නිවැරදිව සටහන් කිරීම බෝග වාර්තා නඩත්තුව ලෙස හැඳින්වේ.

SL-GAP සහතිකකරණ අංශය මඟින් හඳුන්වා දී ඇති බෝග වාර්තා පොත මඟින් මේ සඳහා මග පෙන්වීමක් ලබාගත හැකිය. (අදාළ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගෙන් සහ පහත වෙබ් අඩවියෙන් බාගත (download) කර ගත හැකිය. (www.slgap.doa.gov.lk) (ඇමුණුම 01)

බෝග වාර්තා පොත ගොවිපල වාර්තා සටහන් කිරීම සඳහා යොදාගත හැකි අතර විශාල ගොවිපල සඳහා මෙම පොතෙහි දක්වා ඇති මාතෘකා අනුව බෝග වාර්තා නඩත්තු කළ හැකිය.

3.9.3. උපදෙස් සටහන් පොත (Instruction Book)

තාක්ෂණික නිලධාරීන් විසින් ලබාදෙනු ලබන උපදෙස් හා අදහස් ලිඛිතව සටහන් කිරීම සඳහා භාවිතා කළ යුතුය.

3.9.4. ලිපි ලේඛන ගොනු (Files)

ඉහත බෝග වාර්තා වලට අමරතව විශේෂ ලේඛන අමුණා තැබීම සඳහා යොදා ගැනේ. උදා:

ලේඛන ගත ලේඛනය - සියලුම ලේඛනවල හා ගොනුවල නාමයන් අංකනය කර සටහන් කර ඇති ලේඛනය.

සහතික පත්‍ර අඩංගු ගොනුව - මින්පෙර ගොවිපල සඳහා ලබාගෙන ඇති SL-GAP/වෙනත් තත්ත්ව සහතික හා ලැබූ පුහුණු සහතික වැනි සහතික අඩංගු ගොනු.

පරීක්ෂණ වාර්තා අඩංගු ගොනුව - ජල පරීක්ෂණ වාර්තාව/ පාංශු පරීක්ෂණ වාර්තාව වැනි වාර්තා අඩංගු ගොනුව.

වගා භූමියේ පෙර භාවිතය සහ වගා කළ බෝග පිළිබඳ වාර්තා/වගා බිමෙහි සිතියම.

යෝජනා හා චෝදනා ගොනුව - ගොවිපල සඳහා ලබාදී ඇති අභ්‍යන්තර විගණන වාර්තා/ අනනුකූලතා හෝ වෙනත් අඩුපාඩු දැන්වූ ලිපි හා ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග ඇතුලත් කළ ගොනුව.

නිවැරදිව සම්පූර්ණ කළ අදාළ ලිපි ලේඛන විගණනය සිදුකරන අවස්ථාවේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කිරීම වැදගත් වේ.

අදාල සියලු වාර්තා

යාවත්කාලීන කර නිවැරදිව සම්පූර්ණ කිරීම. ඉතා පැහැදිලිව සටහන් කිරීම. ගොවිපල විගනණය අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම සිදුකළ යුතුය.

SL-GAP සහතිකකරණය අපේක්ෂා කරන ඔබ, මෙම වාර්තා තොරතුරු නිවැරදිව හා පහසුවෙන් පරීක්ෂා කළ හැකි ලෙස නඩත්තු කර තබා ගැනීම ඉතා වැදගත් වේ.

සහතිකකරණයේ දී මෙම තොරතුරු පාදකව ගොවිපල කටයුතු සම්බන්ධව තොරතුරු ලබා ගන්නා බැවින් සියලු කටයුතු නියමිත දිනට වාර්තා කර තැබීම අත්‍යාවශ්‍ය වේ.

SL-GAP සහතිකකරණයේ දී, සාර්ථක ගොවිපල විගණනයක් සිදුකර ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාදීමට අමතරව, ගොවිපල කටයුතු වල වාර්තා තබාගැනීම මඟින් වාසි රැසක් අත්කර ගත හැකිවේ.

උදාහරණ ලෙස:

- ගොවිපල තුළ සිදුකරන ඉදිරි ක්‍රියා මාර්ග පිළිබද තීරණ ගැනීම පහසුවෙන් හා නිවැරදිව සිදුකළ හැකිවීම.
- ගොවිපලේ ලාභ අලාභ තත්ත්වය දැන ගැනීමට උපකාරී වන අතර, ඒ අනුව ගොවිපල කටයුතු පවත්වාගෙන යාම සහ ඉදිරියේ දී අවශ්‍ය වෙනස් කිරීම් සඳහා වඩාත් කාර්යක්ෂමව කටයුතු කිරීමට හැකි වේ.
- වෙනත් වගා ක්‍රම භාවිතය, කම්කරු ශ්‍රමය යෙදවීම හෝ යාන්ත්‍රීකරණය තීරණය කිරීම් ආදී තාක්ෂණික කටයුතු මෙහෙයවීම හා තීරණ ගැනීම පහසු වීම. ගොවිපලෙහි පෙර වගා තොරතුරු හා සිදුවීම් පදනම්ව තාක්ෂණික තීරණ හා විසඳුම් ක්‍රියාත්මක කළ හැකි වීම ආදීය වේ.
- ණය පහසුකම් හා ආධාර ලබා ගැනීමේදී ගොවිපල තොරතුරු ඉදිරිපත් කිරීමට හැකිවීම.

ඔබ විසින් විගණන අවස්ථාවේ දී ලබාදෙන සියලුම වාර්තා රහස්‍ය වාර්තා ලෙස සලකා කටයුතු කිරීමට සහතිකකරණ අංශය කටයුතු කරනු ඇත.

3.9.5. නිෂ්පාදිතයේ පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් අනුමත ප්‍රතීතනය ලත් පරීක්ෂණාගාරයකදී පලිබෝධනාශක අවශේෂ පරීක්ෂා කර ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම හා අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කිරීම සිදුකළ හැකිය.

උපරිම අවශේෂ මට්ටම ඉක්මවා ඇති අවස්ථාවලදී, නිවැරදි කිරීමේ ක්‍රමවේද පිළිබඳ සැලසුම/ මාර්ග උපදේශ සකස් කර ඉදිරිපත් කිරීම ද සිදුකළ හැක.

3.9.6. අපද්‍රව්‍ය කළමනාකරණය

ගොවිපල කටයුතු වලදී ජනනය වන අපද්‍රව්‍ය හා පරිසර දූෂණය විය හැකි ප්‍රභවයන් හඳුනා ගැනීම වැදගත් වේ.

අපද්‍රව්‍ය නිර්මාණය වන ප්‍රභවයන් අවම කිරීම, නැවත භාවිතා කළ හැකි ද්‍රව්‍ය තෝරා නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය ඒ සඳහා යොදා ගැනීම කළ හැකිය. බෝග කොටස් දිරාපත් කර පසෙහි තත්ත්වය වැඩිදියුණු කිරීමට යොදාගත හැකිය.

3.9.7. පාරිසරික ගැටළු අවම කිරීම

බෝග නිෂ්පාදකයින් දැනට පවතින පාරිසරික නීති රීතිවලට අනුකූලව බෝග නිෂ්පාදනය කළ යුතුය. වාතය, ජලය, පස, ජෛව විවිධත්වය හා අනෙකුත් පාරිසරික ගැටළු පිළිබඳ අවධානය යොමුකර කටයුතු කිරීම අවශ්‍ය වේ.

සංරක්ෂිත හා පාරිසරික වශයෙන් වඩාත් සංවේදී ප්‍රදේශ අයුතු ලෙස භාවිතා නොකළ යුතුය.

SL-GAP ප්‍රමිතීන් අනුව වගා කිරීමේදී පරිසරය ආරක්ෂා වන පරිදි වගා කටයුතු කිරීම සඳහා වැදගත් ස්ථානයක් හිමිවේ.

3.9.8. පැමිණිලි වාර්තා කිරීම

SL-GAP සහතිකකරණය සඳහා ගොවිපල සකස් කිරීමේදී හා අභ්‍යන්තර විගණනය/ අවසන් විගණනය අවස්ථාවේ දී ලබාදෙන අනනුකූලතා ගොනුකර තබා ගැනීම හා නිවැරදි කිරීම් කිරීමෙන් පසු ඒ පිළිබඳව වාර්තා තබා ගැනීම වැදගත් වේ.

තවද ගොවිපල කටයුතු පිළිබඳ වෙනත් පාර්ශ්වයක් මඟින් හෝ ලබාදී ඇති පැමිණිලි හා යෝජනා මෙන්ම ඒ පිළිබඳ ගත් ක්‍රියාමාර්ග මෙම ගොනුව තුළ වාර්තා කර තැබීම කළ යුතුය.

3.9.9. අභ්‍යන්තර විගණනය

SL-GAP ප්‍රමිතීන් අනුව ගොවිපල කටයුතු පවත්වාගෙන යාමේදී එම ප්‍රමිතියේ අවශ්‍යතාවයන් හා නියමයන් පදනම්ව අවම ලෙස වසරකට එක් වතාවක් හෝ අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම වැදගත් වේ.

එය සම්පූර්ණ කර ලේඛනගත කර තැබීම හා අනනුකූලතා ඇතිවිට ඒවා නිවැරදි කර, ලේඛනගත කර තැබීම අවශ්‍ය වේ.

ඉහතින් සඳහන් කළ ප්‍රමිතීන් අනුව ගොවිපල කටයුතු සිදුකිරීම මඟින් පහසුවෙන් SL-GAP සහතිකය ලබාගත හැකි අතර දේශීය හා විදේශීය වෙළඳපළ සඳහා ගුණාත්මක නිෂ්පාදන සැපයිමට හැකි වේ. තවද වගා කරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සැලසෙන අතර ක්‍රමානුකූල යහපත් වැඩ පරිසරයක් ඇති කර ගැනීමත් වැඩි ලාභයක් උපයා ගැනීමටත් හැකිවනු ඇත.

04. SL-GAP සහතිකකරණ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු පියවර

(අ) SL-GAP සහතිකකරණය සඳහා පියවර

ගොවිපල ක්ෂේත්‍ර තෝරා ගැනීම හා SL-GAP ප්‍රමිතියට අනුව ගොවිපල සැකසීම.
(මේ සඳහා අවශ්‍ය උපදෙස් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගෙන් ලබාගත හැකිය).

↓

ගොවිපල නියමිත පරිදි සකස් කර ඇති දැයි පරීක්ෂා කර බැලීම/ ගොවිපල අභ්‍යන්තර විගණනය සිදු කිරීම
(මෙය තමා විසින් ප්‍රථමයෙන් සිදුකර බැලීම (ඇමුණුම 2 අනුව) හා අවසානයේ තම ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි හෝ සුදුසු නිළධාරිවරයෙකු මඟින් සිදුකර ගැනීම)

↓

SL-GAP සහතිකකරණය ලබාගැනීම සඳහා අයදුම්පත්‍රය නිවැරදිව පුරවා අදාළ ඇමුණුම් ද සහිතව ආසන්නම බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රාදේශීය කාර්යාලය වෙත භාරදීම. ඒ සමඟම SL-GAP සහතිකකරණ ගිවිසුම්පත්‍රය අත්සන් තබා පිටපත් දෙකකින් භාරදීම

(ආ) අයදුම්පත්‍ර ලබාගැනීම

SL-GAP සහතිකය ලබා ගැනීමට අවශ්‍ය වගාකරුවනට SL-GAP සහතිකකරණය සඳහා වූ අයදුම්පත්‍රය, පිරවීමේ උපදෙස් පත්‍රිකාව හා ගිවිසුම් පත්‍රය බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රාදේශීය කාර්යාල මඟින් නොමිලේ ලබාගත හැකි අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි SL-GAP වෙබ් පිටුව හරහා ද බාගත කිරීම කළ හැකිය.

www.slgap.doa.gov.lk → Downloads → SL-GAP Application (Fruits & Vegetables)

(ඇ) අයදුම්පත්‍ර භාරදීම

ගොවිපල සකස්කර අවසන් වූ පසු හා අස්වැන්න නෙලීමට අවම මාස දෙකකට පෙර සම්පූර්ණ කළ අයදුම්පත්‍රය අදාළ ඇමුණුම් ද සහිතව ඔබගේ ප්‍රදේශයට ආසන්න බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රාදේශීය කාර්යාලය වෙත භාරදීම.

අයදුම්පත්‍රය භාරදෙන විට ඒ සමග SL-GAP සහතිකකරණය ලබාගැනීම සඳහා වූ ගිවිසුම්පත්‍රය පිටපත් දෙකකින් අත්සන් තබා අයදුම් පත සමග භාර දීම.

(ඈ) ගොවිපල අවසන් විගණනය සිදු කිරීම

- අස්වැන්න නෙලීමට ආසන්න දිනයක දී ක්ෂේත්‍ර විගණනය සිදු කිරීම සඳහා බීජ සහතික කිරීමේ SL-GAP විගණන නිලධාරීන් පැමිණෙනු ඇත. එසේ පළමු ක්ෂේත්‍ර විගණනය සඳහා පමණක් පැමිණීමට දින 2 කට වත් පෙර ගොවි මහතා හට දැනුම්දීම සිදුකෙරේ.
- අවශ්‍ය අවස්ථාවල දී සාම්පල ලබා ගැනීම සිදු කෙරෙන අතර, විශේෂයෙන් නිෂ්පාදන දූෂ්‍යවීමේ අවධානම් තත්ත්ව වල දී සිදුකෙරේ.

(සාම්පල ලෙස - ජල මූලාශ්‍රයේ සාම්පල, අස්වනු සාම්පල ලබා ගැනීම)

(ඉ) සහතිකපත්‍රය අලුත් කිරීම (Renewal of Certificate)

SL-GAP සහතිකපත්‍රය වසරක කාලයක් සඳහා නිකුත්කරණ අතර SL-GAP සහතිකපත්‍රය කල් ඉකුත් වීමට මාස 03 කට පෙර නිවැරදිව පුරවා සකස් කළ අලුත් කිරීමේ අයදුම්පත බීජ සහතික කිරීමේ ප්‍රාදේශීය කාර්යාලය වෙත භාරදීම සිදුකළ හැකිය.

SL-GAP සහතිකකරණයට අදාළ තොරතුරු විමසීම සඳහා :-
අතිරේක අධ්‍යක්ෂ,
බීජ සහතික කිරීමේ සේවය, ගන්නොරුව.
දුරකථන අංකය - 081-2388217
ෆැක්ස් අංකය - 081-2388217
විද්‍යුත් තැපැල් ලිපිනය scsdoa79@gmail.com
හෝ
අංශ ප්‍රධානී,
SL-GAP සහතිකකරණ අංශය
දුරකථන අංකය - 081-2388414
ෆැක්ස් අංකය - 081-2388414
විද්‍යුත් තැපැල් ලිපිනය -slgapcertification@gmail.com

ඇමුණුම 01

ශ්‍රී ලංකා යහපත් කෘෂි පිළිවෙත් (SL-GAP) යටතේ බෝග වගාව (එළවලු හා පලතුරු)

ගොවිපල වාර්තා නඩත්තුව සඳහා ආදර්ශ ආකෘතිය

වගාකරුගේ නම : ....

ගොවිපල ලිපිනය : ....

ගොවිපල පිහිටීමට අදාල GPS ඛණ්ඩාංකය: N...................... E ....

බෝග වර්ගය : එලවළු/පළතුරු/මිශ්‍රව වගාකර ඇත.

ගොවිපල සිතියම

(මෙහි ප්‍රධාන මාර්ග, අතුරු මාර්ග, ප්‍රසිද්ධ ස්ථාන ඇතුලත්ව ඔබගේ ගොවිපලට පිවිසෙන ගමන් මාර්ගය මෙන්ම, ගොවිපල තුල වගා ක්ෂේත්‍ර අංක වලට අදාලව වපසරිය හා බෝග පිළිබඳවද ගොවිපල තුල පිහිටි ගොඩනැගිලි හා මායිම් ඇතුලත් විය යුතුය)

ගොවිපල මූලික තොරතුරු

ගොවිපලේ වපසරිය

විවෘත - අක්කර: .... වගාව - අක්කර: ....

සේවකයින් ගණන: ....

ඉලක්කගත වෙළඳපොළ: ....

ජල සම්පාදන ක්‍රමය:

පිටාර ☐ බිංදු ☐ විසුරුම් ☐ වෙනත් ☐ ....

ක්ෂේත්‍රය/කට්ටි අංකය හෝ නම	**1**	**2**	**3**	**4**	**5**
වගා වපසරිය					
බෝගය					
ප්‍රභේදය					
පැළ සිටවූ දිනය					
....					
....					

වගා භූමිය හා ජල ප්‍රභවය පිළිබඳ වාර්තාව

	විස්තරය	**ඔව්**	**නැත**
1.	ගොවිපල සඳහා තත්ත්ව කළමනාකරණ සැලැස්මක් සකස්කර තිබේද?		
2.	වගා භූමිය මින් පෙර (වසර 10ක් තුළ) රෝහලක් හෝ කර්මාන්ත ශාලාවක් හෝ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීමට යොදාගත් ස්ථානයක පිහිටා තිබේ ද?		
3.	පාංශු සංරක්ෂණ පනතට අනුව (60% අඩු) ඉඩමේ බෑවුම බෝග වගාවට උචිත වේද?		
4.	භූමියට උචිත පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා කර තිබේ ද?		
5.	පාංශු පරීක්ෂාවක් සිදුකර තිබේ ද?		
6.	පොහොර භාවිතය පස් පරීක්ෂණ වාර්තා පදනම්ව සිදු කරන්නේද?		
7.	ජල සම්පාදනය සඳහා යොදා ගන්නා ජල ප්‍රභවය දූෂ්‍ය නොවන ලෙස සකසා තිබේද?		
8.	වගාබිම වෙත, මිනිස් වාසස්ථාන හෝ සතුන් ඇති කරන ස්ථාන හෝ කර්මාන්ත ශාලා පිහිටා ඇති පරිශ්‍රයන් හරහා හෝ අධික ලෙස රසායනික ද්‍රව්‍ය භාවිතා කර නිෂ්පාදන කටයුතු සිදු කරන ස්ථාන හරහා ජලය ගලා එනවා ද?		
9.	වගාවන් සඳහා ජලය ලබාගන්නා ලිං පොකුණු වැනි ජල ප්‍රභව වල ඇති ජලය අවට පිහිටි වගා භූමි සඳහා යොදනු ලබන රසානික ද්‍රව්‍ය වලින් දූෂණයවීමේ අවධානමක් තිබේ ද?		
10.	වගා භූමිය අධික වර්ෂා කාලයේදී ජලයෙන් යටවීමේ අවධානමක් තිබේ ද?		
11.	වගාවන් සඳහා භාවිතා කරන ජලයේ මූලික ජල පරීක්ෂාවක් සිදුකර තිබේ ද?		
12.	අස්වනු සැකසීමේදී සේදීමකට ලක්කරන්නේ ද?		
13.	අස්වනු සේදීම සඳහා පානයට සුදුසු ජලය යොදාගන්නේද?		
14.	අස්වනු නෙලීමේදී හා සැකසීමේදී අස්වනු දූෂ්‍ය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද? (පිරිසිදු ප්ලාස්ටික් කූඩ/ බර කිරීම හා සැකසීම සඳහා යොදාගන්නා උපකරණ වැනි දෑ භාවිතය)		
15.	පළිබෝධනාශක ආරක්ෂිතව පරිහරණය කිරීම සඳහා විසිරුම් උපකරණ හා පළිබෝධනාශක යෙදීම පිළිබඳව පුහුණු ලබාගෙන තිබේද?		
16.	යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීම්/ පුහුණු ලබා ගෙන තිබේද?		

	පසුගිය වර්ෂය	**ඉන් පෙර වර්ෂය**
මින් පෙර වර්ෂ දෙකක් තුල වගා භූමියේ භාවිතය සඳහන් කරන්න		

ගොවිපල අවධානම් කළමනාකරණය

අවධානමෙහි ස්වභාවය		අවධානම කළමනාකරණය කිරීමට ගත් පියවර
උදා.	යාබද වගා භූමියට අධික ලෙස කෘෂි රසායන යොදන බැවින් එම වගාව සෝදාගෙන එන වැඩි ජලය මඟින් මාගේ වගා භූමිය දූෂණය වීම.	එම ජලය ගලා නොඑන පරිදි අගලක් කැපීම.
1.		

ගොවිපල බෝග සැලැස්ම (............ දින සිට .... දින දක්වා ඉදිරි වසරක කාලය සඳහා)

බෝගය / ප්‍රභේදය	වගා කාලය														
	ජන.	පෙබ.	මාර්.	අප්‍රේ.	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.	පෙබ.	මාර්.

වෙනත් විශේෂ සැලසුම් තිබේනම් සඳහන් කරන්න:

....

....

....

- යටි වගාවක්/ මිශ්‍ර වගාවක් පවතීනම් එම බෝග ද ඇතුළත් කළ යුතුය.

වගා කිරීමට භාවිතා කළ රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම පිළිබඳ වාර්තා

මිලදීගත් දිනය	මිලදීගත් යෙදවුම් වර්ගය	ප්‍රමාණය	මිල (රු.)	මිලදීගත් ස්ථානය	කාණ්ඩ අංකය	නිෂ්පාදිත ආයතනය	පැළ සිටවූ දිනය

කෘෂි රසායන හා පොහොර මිලදී ගැනීම් පිළිබඳ විස්තර සටහන් කිරීම

මිල දී ගත් දිනය	මිල දී ගත් ද්‍රව්‍ය (වෙළඳනම හා රසායනිකය) (රසායනික/කාබනික/දියර පොහොර වර්ග, කෘමි නාශක, දිලීර නාශක, වල් නාශක, හෝමෝන වර්ග ආදිය)	ප්‍රමාණය	මිල දී ගත් ස්ථානය	මිල (රු.)

සියළුම පොහොර හා හෝමෝන ආදිය යෙදීම් පිළිබඳ සටහන්

දිනය	කට්ටි අංකය	වර්ගය (වෙළඳනම හා අඩංගු රසායනිකය)	යෙදූ ප්‍රමාණය	යොදන ක්‍රමය (මූල මණ්ඩලයට/ පත්‍ර මතට)	යෙදූ පුද්ගලයා	නිර්දේශය ලබාදුන් ආයතනය/නිලධාරියා

රෝග හා පළිබෝධ පාලනය පිළිබඳ වාර්තා

I). රසායනික නොවන පළිබෝධ පාළන ක්‍රම

(ආවරණ වැටක් සැකසීම/ සාරි හෝ පොලිතීන් වැටක් යෙදීම/ඵල ආවරණය/කවර යෙදීම/ඇලෙන උගුල් භාවිතය/පෙරමෝන උගුල් භාවිතය/ආලෝක උගුල් භාවිතය/කෘමි විකර්ශක ශාක භාවිතය ආදී පාලන ක්‍රම)

දිනය	කට්ටි අංකය	මර්ධනය කිරීමට අවශ්‍ය රෝග/පලිබෝධකයින්	භාවිතා කළ පාළන ක්‍රමය/ක්‍රම	නිර්දේශ කල ආයතනයේ/ නිලධාරියාගේ නම

2). රසායනික මර්ධන ක්‍රම පිළිබඳ වාර්තා

ක්ෂේත්‍රය/ කට්ටි අංකය	හඳුනාගත් රෝගය/ පලිබෝධකයා	යෙදූ රසායනිකයේ නම/ වෙළඳ නාමය	යෙදූ ක්‍රමය	යෙදූ ප්‍රමාණය	යෙදූ දිනය	යෙදූ පුද්ගලයා	නිර්දේශ කළ නිලධාරියා/ ආයතනයේ නම

අස්වනු නෙලීම හා අලෙවිය පිලිබඳ වාර්තා

දිනය	කට්ටි අංකය	බෝගය/ වර්ගය	ලබාගත් අස්වැන්න (කි.ග්‍රෑ.)	අලෙවිය					
				GAP ආකාරයට			සාමාන්‍ය ආකාරයට		
				ප්‍රමාණය (කි.ග්‍රෑ.)	විකුණුම් මිල (රු.)	මිලදී ගත් අය හෝ ආයතනය	ප්‍රමාණය (කි.ග්‍රෑ.)	විකුණුම් මිල (රු.)	මිලදී ගත් අය හෝ ආයතනය

වෙනත්:

....

....

ඇමුණුම 02

කෙසෙල් වගාව සඳහා SL-GAP සහතිකකරණයට ඉල්ලුම් කිරීමට පෙර ස්වයං ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර ගැනීමට අදාල පිරික්සුම් ලැයිස්තුව

SL-GAP සහතිකකරණය සඳහා ගොවිපලක තිබිය යුතු තත්වයන් පහතින් දක්වා ඇත. ඔබගේ ගොවිපලේ වර්තමාන තත්ත්වය දැන ගැනීම සඳහා අදාල පාලන කරුණට ඉදිරියෙන් අනුකූලතාවය දැක්වීම සඳහා හරි (√) හෝ වැරදි (X) ලකුණ යොදන්න. ඒ අනුව අනනුකූලතා ඇති නම් නිවැරදි කිරීම සිදුකළ හැකිය.

	ගොවිපලෙහි තිබිය යුතු තත්වයන්	**අනුකූලතාවය**
1	වගා භූමියේ ඉතිහාසය හා කළමනාකරණය	
	වගා බිමෙහි පෙර භාවිතයන් හා පෙර වගාකල බෝග පිළිබඳ වාර්තා තිබීම.	
	වගා භූමියේ පෙර භාවිතය, යාබද භූමි වල වගාවන් සහ ක්‍රියාකාරකම් මගින් ඇතිවිය හැකි බලපෑම් අනුව ඇතිවිය හැකි අවධානම අවම කිරීමට කටයුතු කිරීම.	
	ගොවිපලෙහි පිහිටීම, එහි වපසරිය, ක්ෂේත්‍ර අංක/බෝග හා ඊට යාබද ඉඩම් වල සිදුකරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් සිතියමක් සකස් කිරීම.	
	ගොවිපලෙහි බෝග වගා කිරීම සඳහා අවසරයක් තිබීම.	
2	රෝපණ ද්‍රව්‍ය	
	රෝපණ ද්‍රව්‍ය/මොරෙයියන්, හානිකර පළිබෝධ, වෛරස් ආදී රෝග වලින් තොර නිරෝගී ඒවා වීම.	
	රෝපණ ද්‍රව්‍ය ලබාගත් ස්ථානයේ/ගොවිපලෙහි නම හා ලිපිනය, තොගය හඳුනා ගැනීමේ කාණ්ඩ අංකය, සැපයූ දිනය සටහන් කර තැබීම.	
3	පොහොර කළමනාකරණය	
	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත පොහොර නිර්දේශය ලිඛිතව සටහන් කර තිබිය යුතු අතර වෙනසක් වේ නම් එයද සටහන් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය.	

	ගොවිපලෙහි තිබිය යුතු තත්වයන්	අනුකූලතාවය
	පත්‍ර මතට හා පසට සිදු කරනු ලබන සියලුම පොහොර (කාබනික හා රසායනික) සහ යෙදීම් පිළිබඳ වාර්තා තිබිම.	
	ජාතික පොහොර ලේකම් කාර්යාලය මඟින් ලියාපදිංචි කළ රසායනික පොහොර වර්ග තෝරා ගැනීම හා යෙදීම	
	භාවිතා කරන ලද පොහොර මළු ආහාර නිෂ්පාදන ගබඩා කිරීමට හෝ ආහාර ද්‍රව්‍ය සමඟ ස්පර්ශ වන සේ තැබීම සිදුනොකිරීම.	
	පොහොර ගබඩා කිරීමේදී, ගුණාත්මයට හානි නොවන පරිදි හොඳින් ආවරණය වූ පිරිසිදු වියළි ස්ථාන වල ගබඩා කර තිබිය යුතුය.	
	ගොවිපලට බැහැරින් කාබනික පොහොර ලබා ගන්නේ නම්, එහි ප්‍රභවය පිළිබඳ වාර්තා තිබිය යුතුය.	
	මිනිස් මළ අපද්‍රව්‍ය හෝ මළ අපවහන ජලය පොහොර ලෙස භාවිතා නොකිරීම.	
4	ජල සම්පාදනය	
	යොදා ගන්නා ජල ප්‍රභවය රසායනිකව හෝ ජෛවීය දූෂක මගින් දූෂ්‍යවීමේ අවදානම අවම කර ආරක්‍ෂාකාරීව පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.	
	පැළ වගා කටයුතු සඳහා යොදා ගන්නා ජලය පිරිසිදු විය යුතුය.	
	නාගරික ගොඩකළ ඉඩම්, රෝහල් හා කර්මාන්තශාලා අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන, වෙනත් වගා භූමි වැනි අහිතකර ප්‍රභවයන්ගෙන් ගලා එන ජලය මඟින් ජල සැපයුම දූෂණය වී නොතිබිය යුතුය.	
	පසු අස්වනු කටයුතු වලදී භාවිතා කරනු ලබන ජලය පානීය ජලය සඳහා වූ ප්‍රමිතීන් සමඟ අනුකූල විය යුතුය.	
5	බෝග ආරක්‍ෂා කිරීම	
	බෝග ආරක්ෂා කිරීම පිණිස පළිබෝධනාශක භාවිතය අවම කර හැකි සෑම අවස්ථාවකදීම පිළිගත් ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම භාවිතා කිරීම. (රසායනික ප්‍රතිකර්ම යෙදීමට වඩා රසායනික නොවන පළිබෝධ පාලන පිළිවෙත් සදහා යොමුවීම.	
	වගා භූමිය වටා, ඉලක්ක ගත පළිබෝධකයන් ඇතුළු නොවන සේ ක්ෂේත්‍ර වටා සකස් කළ ආරක්ෂිත වැටක් තිබීම.	

	ගොවිපලෙහි තිබිය යුතු තත්වයන්	අනුකූලතාවය
	සතුන් ඇතුළු නොවනසේ ආරක්ෂිතව සැකසූ තාවකාලික ඇසුරුම් ස්ථානයක් තිබීම.	
	වගා ක්ෂේත්‍රය හා පරිශ්‍රයන් මනා සනීපාරක්ෂාවකින් යුතුව කැලි කසල වලින් තොරව ඉතා හොඳින් පවත්වා ගෙන තිබීම.	
	පළිබෝධනාශක තෝරා ගැනීම	
	නිර්දේශිත පළිබෝධනාශක, බෝග-පළිබෝධ සංකලනය (Crop-pest combination) අනුව භාවිතා කිරීම.	
	1980, අංක 33 දරණ පළිබෝධනාශක පාලන පනත යටතේ ලියාපදිංචි කල පළිබෝධනාශක පමණක් යොදා තිබීම.	
	පළිබෝධනාශක භාවිතයේදී, යෙදීම් සිදු කරන දින, යෙදීමට හේතුවූ පළිබෝධය, භාවිතා කළ පළිබෝධනාශකයේ නම, යෙදූ මාත්‍රාව, යෙදූ ක්‍රමය හා යෙදූ තැනැත්තාගේ නම ආදි තොරතුරු ඇතුලත් කර වාර්තා නඩත්තු කිරීම.	
	නිශ්චිත නිර්දේශ නොමැතිව පළිබෝධනාශක වර්ග දෙකක් හෝ කිහිපයක් එකට මිශ්‍ර නොකිරීම.	
	මිශ්‍රණ සැකසීම සඳහා පිරිසිදු ජලය භාවිතා කිරීම.	
	පළිබෝධනාශක ගබඩාකරණය	
	ලේබලයට හානි නොකොට පළිබෝධනාශක ඒවායේ මුල් ඇසුරුමෙන්ම ගබඩා කොට තැබීම	
	හිස් පළිබෝධනාශක බඳුන් සිදුරු කිරීම/තැලීම හෝ කිසිසේත් ගිනි තැබීම සිදු නොකර ආරක්ෂිතව තබා තිබීම.	
	පෙර අස්වනු කාල සීමාව	
	පළිබෝධනාශක ලේබලයෙහි සඳහන් පෙර අස්වනු කාල සීමාව ආරක්ෂා වන පරිදි කටයුතුකර තිබීම.	
	ආරක්ෂිත ඇඳුම් කට්ටලය හා ආම්පන්න	
	සුදුසු ආරක්ෂිත ඇඳුම් කට්ටලයකින් හා ආම්පන්නවලින් පළිබෝධනාශක යෙදීමේ දී ක්‍රියාකරුවන් සමන්විත වීමට කටයුතු කිරීම.	

	ගොවිපලෙහි තිබිය යුතු තත්වයන්	අනුකූලතාවය
6	අස්වනු නෙලීම හා පරිහරණය	
	සුදුසු පරිණතියේදී අස්වනු නෙලීම.	
	කෙසෙල් කැන් පසේ නෙගෑවෙන සේ සුදුසු ඇතුරුම් මත තැබීම	
	අස්වැන්න ක්ෂේත්‍රයෙන් ඉවත්කර සතුන්ගෙන් හා වෙනත් දූෂක මගින් ආරක්ෂාවන පරිදි පිරිසිදු තාවකාලික ඇසුරුම් ස්ථානයක ගබඩා කිරීම.	
	නිෂ්පාදනයේ ගුණාත්මයට හානි නොවන සේ සුදුසු පරිදි අසුරා වෙලඳපොළ කරා ගෙනයාම	
7	පාරිසරික කළමණාකරනය	
	ගොවිපොළ ක්‍රියාකාරකම් මඟින් පරිසරයට හානිකර බලපෑම් ඇති නොවීම.	
8	නීතිමය අවශ්‍යතාවය	
	සියලු ගොවිපල කටයුතු හා නිෂ්පාදන සෑම අතින්ම ශ්‍රී ලංකාව තුළ දැනට බලපැවැත්වෙන නීති පද්ධතියේ අවශ්‍යතාවයන් සමඟ අනුකූල කටයුතු කිරීම.	
9	ලිපි ලේඛන අවශ්‍යතා	
	බෝග සැලැස්ම - නිවැරදිව බෝග කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.	
	ගොවිපල කටයුතු ආරම්භයේ සිට ගොවිපල භූමියෙන් නිෂ්පාදන බෙදා හරින අවස්ථාව දක්වා අදාල ක්‍රියාකාරකම් වාර්තා කිරීම.	
	GAP සහතික ලත් ගොවිපල නිෂ්පාදන හඳුනා ගත හැකිවන පරිදි ගොවිපල තුළ හා ප්‍රවාහනයේදී විධිමත් ක්‍රමයක් භාවිතා කර තිබීම.	

පරිශීලන ග්‍රන්ථ

01. ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහතිකකරණය, මාර්ගෝපදේශ සංග්‍රහය, කෘෂිකර්ම දෙපාර්තමේනතුව - 2022

02. කෙසෙල් වගාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 2022

In line with the vision of
the Government of Sri Lanka

An initiative of the Department of Agriculture
With support from UNIDO under the BESPA-FOOD Project funded by the Delegation of the European Union to Sri Lanka

UNITED NATIONS
INDUSTRIAL DEVELOPMENT ORGANIZATION

BESPA-FOOD
BEST STANDARDIZED PRACTICES FOR AGRI-FOOD

Funded by
the European Union